ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,719 — 1966 ඔක්තෝබර් 27 වැනි බ්‍රහස්පතින්ද — 1966.10.27

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන | 767 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන | 775 |
| සභාතුරු-ඇබෑර්තු | 768 | අය-වැය ලේඛන | 776 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය | — | දේපළ විකිණීම | — |
| අතුරු ව්‍යවස්ථා | 774 | මාර්ග කොමිටි දැන්වීම් | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් | — | විවිධ දැන්වීම් | 779 |


## පළාත් පාලන නිවේදන

ඇල්.ඩී—බී. 31/47

### ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත

84 වැනි වගන්තිය යටතේ වූ ආඥාව

(262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ 26(2) (අ) වැනි වගන්තිය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ මැතිවරණ නිලධරයා විසින් ප්‍රසිඛ කරනු ලැබූ 1966 සැප්තැම්බර් 14 වැනි දින දරන දැන්වීමෙන්, කොළඹ දිස්ත්‍රික්කයේ පූගොඩ ගම් ප්‍රදේශයේ ගම් සභාවේ අංක 8 දරන ඡන්ද කොට්ඨාශය වෙනුවෙන් තෝරා පත් කර ගැනීම සඳහා අපේක්ෂක යන්ගේ නාම යෝජනා භාරගැනීමේ දිනය වශයෙන් 1966 සැප්තැම්බර් තිස් වැනි දිනය නියම කරන ලද හෙයින් ද,

ඉහත කී ඡන්ද කොට්ඨාශය සඳහා තෝරා පත් කිරීම පිණිස, එකී දිනයේ දී බලාපොරොත්තු නොවූ හේතූන් නිසා, කිසිම අපේක්ෂකයකු විසින් හෝ වෙනුවෙන් කිසිම නාමයෝජනා පත්‍රයක් තේරීම්භාර නිලධරයාට භාර දිය නොහැකි වූ හෙයින් ද,

ඉහත කී කොට්ඨාශය සඳහා තෝරා පත් කිරීම පිණිස අපේක්ෂක යන්ගේ නාම යෝජනා කිරීම සඳහා විශේෂ විධිවිධාන පැනවීම අවශ්‍යව ඇති හෙයින් ද,

(262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ 84 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති, මුරුගේසන් තිරුචෙල්වම් වන මම, මේ ආඥාවෙන්—

(1) කොළඹ දිස්ත්‍රික්කයේ පූගොඩ ගම් ප්‍රදේශයේ ගම් සභාවේ අංක 8 දරන ඡන්ද කොට්ඨාශය සඳහා තෝරා පත් කර ගැනීම පිණිස අපේක්ෂකයන්ගේ නාම යෝජනා භාර ගැනීම කළ යුතු වූ දිනය වශයෙන් 1966 සැප්තැම්බර් තිස් වැනි දින නියම කරමින්, (262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ 26(2) (අ) වැනි වගන්ති යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ මැතිවරණ නිලධරයා විසින් ප්‍රසිඛ කරනු ලැබූ 1966 සැප්තැම්බර් 14 වැනි දින දරන දැන්වීම අවලංගු සහ බලරහිත විය යුතුවාක් මෙන්ම, සෑමවිටම එලෙස අවලංගු සහ බල රහිත වී ඇතැයි සැලකිය යුතු බව ; සහ

(2) කොළඹ දිස්ත්‍රික්කයේ මැතිවරණ නිලධරයා විසින්, යථෝක්ත ඡන්ද කොට්ඨාශය සඳහා තෝරා පත් කරගනු ලැබීම පිණිස අපේක්ෂකයන්ගේ නාම යෝජනා පත්‍ර භාර ගැනීම සඳහා වෙනත් දිනයක් නියම කරමින්, ඒ වගන්තිය යටතේ අළුත් දැන්වීමක් ප්‍රසිඛ කළ යුතු බව

ප්‍රකාශ කරමි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1966 ඔක්තෝබර් 18 වැනි දින,
කොළඹ දී ය.

10-1051—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් එය එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.**

**බර්නාඩ් ද සිල්වා,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

**1966 ජූලි මස 15 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණාලය.**
**කොළඹ.**

ඇල්. ඩී.—බී. 58/35.

## නාවලපිටිය නගර සභාව

### නගර සභා ආඥාපනත

### 1966 සඳහා වූ කසළ ශෝධන විශේෂ වරිපනම් බද්ද

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 130(ආ) වන වගන්තිය යටතේ සහ ඒ වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් දෙන ලද අනුමතිය ඇතිව, අතුරු ව්‍යවස්ථාවලින් නියම කළ හැකි සීමා කිරීම් හා නිදහස් කිරීම්වලට යටත්ව, නාවලපිටිය නගරය තුළ පිහිටා තිබෙන සියලු ම නිශ්චල දේපළවල වාර්ෂික වටිනාකමින් සියයට හතර බැගින් වූ කසළ ශෝධන විශේෂ වරිපනම් බද්දක් පිළිවෙළින් ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හි සමාන කොටස් තුනකින් ගෙවා අවසන් කළ හැකි පරිදි නාවලපිටිය නගර සභාව විසින් 1966 වර්ෂය සඳහා පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1966 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ දීය.

10–1058/1—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

---

ඇල්. ඩී.—බී 58/35.

## නාවලපිටිය නගර සභාව

### නගර සභා ආඥාපනත

### 1966 සඳහා වූ ජලය පිළිබඳ විශේෂ වරිපනම් බද්ද

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 130(ආ) වන වගන්තිය යටතේ සහ ඒ වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් දෙන ලද අනුමතිය ඇතිව, අතුරු ව්‍යවස්ථාවලින් නියම කළ හැකි සීමා කිරීම් හා නිදහස් කිරීම්වලට යටත්ව, නාවලපිටිය නගරය තුළ පිහිටා තිබෙන සියලු ම නිශ්චල දේපළවල වාර්ෂික වටිනාකමින් සියයට දෙක බැගින් වූ ජලය පිළිබඳ විශේෂ වරිපනම් බද්දක්, පිළිවෙළින් ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හි සමාන කොටස් තුනකින් ගෙවා අවසන් කළ හැකි පරිදි නාවලපිටිය නගර සභාව විසින් 1966 වර්ෂය සඳහා පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1966 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ දී ය.

10–1058/2—66.10.27 දින අංක 14,719 දරණ ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥා පනත

1961 අංක 60 දරණ ගම්සභා (සංශෝධිත) පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය) ගම්සභා ආඥා පනතෙහි 13 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරුන බලතල ප්‍රකාර, මහනුවර පාලන දිස්ත්‍රික්කයේ සහකාර පළාත් පාලන කොමසාරිස් ලියන මුදියන්සෙලාගේ සමරසිංහ වන මම, මහනුවර දිස්ත්‍රික්කයේ මැද දුම්බර මැදසිය පත්තු ගම්සභාවේ අංක 3 දරණ කොට්ඨාශයෙහි සභික ඇම්. ජී. රංකිරා මහතා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවලින් සභාවේ රැස්වීම් වාර තුනකට වැඩි ගණනකට, තමන් තෝරා පත්කර ගැණීමෙන් පසු නොපැමිණිබව ගැන සෑහීමට පත්ව, මහනුවර දිස්ත්‍රික්කයේ මැද දුම්බර මැදසියපත්තුවේ ගම්සභාවේ අංක 3 දරණ කොට්ඨාශයෙහි සභික මනන්නලෑ ගෙදර රංකිරා මහතා මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ කිරීමේ දින සිට තම සභිකත්වය අත්හරිනලදබව, මෙයින් ප්‍රකාශ කරමි.

ලී. මු. සමරසිංහ,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
මහනුවර.

1966 ඔක්තෝබර් 9 වෙනි දින,
මහනුවර පළාත් පාලන අමාත්‍යාංශයේදීය.

10–1036—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

---

ඇල්. ඩී.—බී. 29/56

## සුළු නගර සභා ආඥාපනත

### 183 වන වගන්තිය යටතේ වූ ආඥාවයි.

1957 අංක 2 දරන පනතින් සංශෝධිත (256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ, 183 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති මුරුගේසන් තිරුචෙල්වම් වන මම, ඉහතකී වගන්තිය යටතේ තිස්සමහාරාම නගරයට අදළව පනවනු ලැබ, 1966 මැයි 6 වැනි දින අංක 14,694/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද්ද වූ ද, 1966 අගෝස්තු 26 වැනි දින අංක 14,710 දරන ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ ආඥාවෙන් සංශෝධනය කරන ලද්ද වූ ද ආඥාව එහි (ආ) ඡේදය වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කිරීමෙන් මේ ආඥාවෙන්, 1966 ඔක්තෝබර් මස 8 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සංශෝධනය කරමි :—

" (ආ) ඒ ආඥාපනත යටතේ තිස්සමහාරාම නගරය සඳහා අලුතෙන් සුළු නගර සභාවක් සංස්ථාපනය කරනතුරු සහ ඒ සභාව විසින් සභාපතිවරයකු තෝරා පත් කර ගනු ලබන තෙක් ඒ නගරයේ කටයුතු පරිපාලනය කිරීම පිණිස ද, ඒ කාර්‍ය්‍ය සඳහා ඒ ආඥාපනත යටතේ සුළු නගර සභාවක බලතල පාවිච්චි කිරීම හා යුතුකම් ඉටු කිරීම පිණිස ද පළාත් පාලන සහකාර කොමසාරිස් හෙට්ටිආරච්චිගේ පියදාස අබේවර්ධන මහතා විශේෂ කොමසාරිස් වශයෙන් පත් කරමි. "

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1966 ඔක්තෝබර් මස 25 වැනි දින,
කොළඹ දී ය.

10–114—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

---

# තනතුරු — ඇබෑර්තු

## ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

1. **දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශෙෂ ජීවන දීමනාව යන මේ දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී, පළාත් පාලන සේවා ආඥාපනතේ (264 වැනි අධිකාරය) විධිවිධාන, ඒ පිළිබඳ සංශෝධන හා ඒ යටතේ සම්පාදිත රෙගුලාසිවලටත්, කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසිවලටත් යටත් වෙයි.

3. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—1952 අගෝස්තු මස 3 වැනි දිනය හා 10,432 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසෙහි පළ කරනලද උපලේඛනයෙහි සඳහන් තනතුරුද කලින් කල ඒ උපලේඛනයට එකතු කරන අනික් තනතුරුද ස්ත්‍රීන් නොවන පළාත් පාලන සේවා සාමාජිකයන් විසින් උසුලන ලබද්දී, 1952 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම රෙගුලාසි යටතේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරු වන්නේ ය.

(අ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන් ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වැනි වගන්තිය යටුතේ සේවයෙන් මුද

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මෙම කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නොලැබේ. අයදුම් පතක් තැපෑලේදී ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම් පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූම ඒ අවදානමට මුහුණ පාති.

## අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පත් ආකෘතිය

පළාත් පාලන සේවය

සැ. යු.—(i) අයදුම්පත්‍ර මෙහි පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට, තනතුර අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන් අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම්පත්‍ර සභාපතිගේ පෞද්ගලික නාමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරගනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැලකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදාළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවෝ ස්වකීය අයදුම්පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි සිංහල, දෙමළ යන භාෂාවලින් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාළ වෙන වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

### ————තනතුර සඳහාවූ අයදුම්පතයි

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය: ————.

(ආ) ඉල්ලුම් කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.

ජාතිය :————.

(එම ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත් සැඳහුම් අංකයත් සඳහන් කරන්න)

3. තැපැල් ලිපිනය :————.

(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම් වයස අවුරුදු——, මාස——, දින——.

(ආ) උපන් දිනය :————.

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පස මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඉ) හෝ පිරවිය යුතුයි.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| | පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| | විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමග :—

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතනවල නම් :————.

10. ඉගෙනගත් පාඨශාලාව හා එයින් අස්වූ දිනය :————.

11. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයත් හා අස්වූ දිනයත් දක්වමින් ඇරූ තනතුරු සඳහන් කරන්න) :————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතන යක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දන්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ (තනතුරු), පළාත් පාලනායතන හා කාලසීමාවන් : ————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප් හා වැටුප් ක්‍රමය :————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද :————.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම්—
සේනාංකය තරාතිරම, සේවයට බැඳුන දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කතා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :————.

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශෙෂ සුදුසුකම්—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශෙෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම් ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේ ද ? එසේ නම් දිනය, නඩු කොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නැත් නම් ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ ශිම්කම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————. (ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ).

මේ අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සභාපති,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැපැල් පෙට්ටිය 530,
කොළඹ 1.

---

## පළාත් පාලන සේවය

### සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තනතුරු

ඉහත සඳහන් තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි.

2. තෝරාගනු ලබන අයදුම්කරුවන් පළමුකොටම කොළඹ නාගරික සභාවට පත් කරනු ලබන අතර, කොළඹ නාගරික සභා සීමාව තුළ වාසය කිරීමට ඔවුන්ට නියම කරනු ලැබේ. තවද, පෞද්ගලික වෘත්තියෙහි යෙදීමට ඔහුට අවසර නැත.

3. වැටුප.—තනතුරට නියමිත වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 8,880—9 × 480—2 × 600—රු. 14,400 වේ. මෙම වැටුප් ක්‍රමයෙහි රු. 11,280 යන වාර්ෂික වැටුපෙහි දැවුරුදු නැවැත්මක් සහ රු. 11,760 යන වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමක් ඇත. තෝරාගනු ලබන අයදුම්කරුවන් ඔවුන්ගේ සුදුසුකම් සහ පළපුරුද්ද අනුව වැටුප් ක්‍රමයේ වැටුප් පෙත්තක තැබිය හැක.

4. ඉහත වූ 3 වන ඡේදයෙහි සඳහන් වැටුපට අතිරේකව, ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරීන්ට ගෙවනු ලබන විශ්‍රාම වැටුප් රහිත දීමනා, පත් වීම සඳහා තෝරාගනු ලබන නිලධාරීන්ගේ සුදුසුකම් අනුව, ඔවුන්ටද ගෙවනු ලැබේ.

5. තෝරාගනු ලබන අයදුම්කරුවන් මාරු කිරීමට යටත් වන්නේය.

6. අවශ්‍ය සුදුසුකම්.—අයදුම්කරුවන් ඇම්.බී.බී.ඇස්. (ලංකා) උපාධිය හෝ ඊට සමාන හෝ ඊට උසස් වෙනත් වෛද්‍ය සුදුසුකම් කින් යුක්ත වූවන් විය යුතු අතර, පහත සඳහන් විභාග වලින් එකකින්වත් සමත්ව සිටිය යුතුය :—

(i) ඇම්.ඩී. (ලන්ඩන්) රාජ්‍ය වෛද්‍ය විද්‍යාව ;
(ii) ඩී.පී.එච්. (බ්‍රිතාන්‍ය විශ්ව විද්‍යාලයක හෝ ටොරොන්ටෝහි විශ්ව විද්‍යාලයේ හෝ ඔස්ට්‍රේලියාවේ විශ්ව විද්‍යාලයක) ;
(iii) ඇම්.පී.එච් (ලංකාව පිළිගෙන ඇති අමෙරිකා එක්සත් ජන පදයේ හෝ කැනඩාවේ විශ්ව විද්‍යාලයක හෝ වෛද්‍ය විද්‍යාලයක) ;
(iv) ඇම්.ආර්.සී.පී. (ලන්ඩන්) හෝ (එඩින්බරෝ) ජන සෞඛ්‍ය.

7. මේ ගැසට් පත්‍රයේ ආරම්භයේ පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

8. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට, 1966 නොවැම්බර් මස 15 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන සේ එවිය යුතුයි.

සඳහන් කරන ලද ආකෘති පත්‍රයෙහි 9 වැනි ඡේදය වෙනුවට, පහත සඳහන් කරුණු යොදාගත යුතුයි :—

" 9. ලබා ඇති වෛද්‍ය සහ වෘත්තීය සුදුසුකම්, ඒවා ලබාගත් දින වකවානු සහ ආයතනයන්ගේ නම් සහිතව :— ".

9. අයදුම් පත හෝ අදාළ අනිකුත් ලියුම් එවිය යුත්තේ, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නාමට නොවේ.

10. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත් භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අවසාන දිනට පෙර ලැබුණු බවට සහතික කර, ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

11. සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගේ පමණක්, ඉල්ලුම් පත් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
සභාපති.

1966 ඔක්තෝබර් මස 16 වැනි දින,
තැ. පෙ. 530, කොළඹ.

10–1075—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### දෙවැනි ශ්‍රේණියේ කර්මාන්ත ඕවර්සියර් තනතුරු

ඉහත සඳහන් තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. තෝරාගනු ලබන අපේක්ෂකයින් පළාත් පාලන සේවයේ දෙවැනි ශ්‍රේණියේ කර්මාන්ත ඕවර්සියර් තනතුරුවලට පත්කරනු ලැබේ. ඔවුන්ගේ සාමාන්‍ය රාජකාරි කටයුතුවලට අතිරේකව, ආදායම් සහ/හෝ සෞඛ්‍ය කටයුතු පිළිබඳව වැඩ කිරීමටද ඔවුන්ට නියම කිරීමට පිළිවන. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක රාජකාරි කිරීමට ඔවුන් සූදානම් විය යුතුය.

3. එක තනතුරකට හිමි වාර්ෂික වැටුප රු. 750 කි. එය රු. 750 න් පටන් ගෙන, වර්ෂයකට රු. 42 බැගින් 14 වරක් වැඩිවී, වර්ෂයකට රු. 1,338 දක්වා නගී. ජෙවල් කුලී දීමනා, තාවකාලික ජීවන වියදම් දීමනා සහ විශේෂ ජීවන වියදම් දීමනා ආණ්ඩුවේ ප්‍රමාණයන්ට හා කොන්දේසි අනුව ගෙවනු ලැබේ. ගමන් වියදම් දීමනාවක් ද ගෙවනු ලැබේ. තනතුරු ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. පත්කරනු ලැබූ අපේක්ෂකයෝ පළාත් පාලන සේවා වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදලේ දායකයෝ වීමට සුදුස්සෝ වෙති.

4. තෝරාගනු ලබන අපේක්ෂකයින් අවුරුදු තුනක ආධුනික කාලයකට පත්කරනු ලැබේ. ඔවුහු පළාත් පාලන ආඥාපනතට හා ඒ යටතේ සම්පාදිත රෙගුලාසිවලට යටත් වෙති.

5. ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහාත්, විශේෂයෙන්ම රාජ්‍ය භාෂා පනතේ විධිවිධානයන් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහාත්, මෙතෙක් සම්පාදිත නියෝග හෝ මින්මතු සම්පාදනය කළහැකි නියෝගවලටත් අනුකූලව ක්‍රියා කරන ලෙස තෝරාගනු ලැබූ අපේක්ෂකයින්ට නියම කරනු ලැබේ.

ස්වකීය ආධුනික කාලය තුළදී මෙම නිලධාරීන් සිංහල භාෂාවේ විෂයයෙහි ප්‍රවීණතාවයක් ලබාගත යුතුයි. ආධුනික කාලය අවසානයේදී ඔවුන්ගේ පත්වීම ස්ථිර කිරීම, සිංහල ප්‍රවීණතා පරීක්ෂණයකින් සහ ලංකා කාර්මික විද්‍යාලීය පුහුණුවකින් පසු පවත් වනු ලබන පරීක්ෂණයකින් සමත් වීම මත රඳා පවතී.

ස්වකීය ආධුනික කාලය ඇතුළතදී සිංහල භාෂා ප්‍රවීණත්වයෙහි ලා නියමිත තත්ත්වයකට පැමිණීමට නොහැකි වන නිලධාරීන්ගේ සේවය නැවැත්විය හැකිය. එහෙත්, රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයක් ලබා ගැනීම සඳහා අවංක ප්‍රයත්නයක් දරා ඇති බවට පළාත් පාලන සේවා කොමිෂන් සභාවට සෑහීමකට පත්විය හැකිනම්, එසේ සේවය නතර කිරීම කල් දැමිය හැකිය. නියමිත දිනයෙන් පසු සාධාරණ කාල පරිච්ඡේදයක් ඇතුළතදී නිලධාරියා පරීක්ෂණයෙන් සමත් වුවහොත්, කොමිෂන් සභාවේ අභිමතය පරිදි ජ්‍යෙෂ්ඨතාව සම්බන්ධයෙන් වූ පාඩුව නොසලකා හැරිය හැකිය.

9. අයදුම්පත්, පත්වීම් සම්බන්ධයෙන් අදාල වන සාමාන්‍ය කොන්දේසිය යටතේ සඳහන් කොට ඇති ආකෘති පත්‍රයෙහි පිළියෙල කොට, 1966.11.15 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුය. පූර්වෝක්ත ආකෘති පත්‍රයෙහි 9 වැනි ශීර්ෂය යටතේ දක්වෙන කරුණු වෙනුවට, පහත සඳහන් කොට ඇති කරුණු යොදාගත යුතුයි :—

(අ) වෛද්‍ය යන වෘත්තිය සුදුසුකම් සහ ඒවා ලබාගත් දිනයන් ආයතනවල නම්,

(ආ) පශ්චාත් උපාධි පාඨමාලා හදාරා ඇත්නම් ඒ පිළිබඳ විස්තර,

10. අයදුම්පත් හෝ ඊට අදාළ අනිකුත් ලියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ යම්කිසි නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

11. නියමිත දිනට පසුව රජයේ හෝ ප්‍රාදේශීය බලමණ්ඩලයක සේවය කරන නිලධාරීන්ගේ මේ කාර්යාලයට ලැබෙන අයදුම් පත්‍ර අවසාන දිනට පළමු ඒ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ප්‍රාදේශීය බලමණ්ඩලයේ නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත හෝ ලැබී ඇති බවට සහතික කර, ප්‍රමාදයට හේතු දක්වමින්, ඒ අයදුම්පත්‍ර භාරගන්නා ලෙස ඔවුන් විසින් නිර්දේශ කරනු ලැබුව හොත් මිස, සලකා බලනු නොලැබේ.

12. සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ අයදුම්පත් පමණක් ලැබුණු බව දන්වනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

1966 ඔක්තෝබර් මස 17 දින,
කොළඹ තැ. පෙ. 530.

10-1055—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### කණිෂ්ඨ පුස්තකාලයාධිපති තනතුර

කොළඹ නාගරික සභාවේ පුස්තකාල සහකාරයන්ගෙන් සහ අනෙක් ප්‍රාදේශීය බලමණ්ඩලවල සේවයේ නියුක්ත 1966.11.15 දිනට වර්ෂ 4 ට නොඅඩු කාලයක් සතුටුදායක ලෙස සේවය කර සිය පත්වීමේ ස්ථිර කර ඇති 1 වන ශ්‍රේණියේ පුස්තකාලයාධිපතීන් වෙතින් ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි.

2. වැටුප :—තනතුරට නියමිත වැටුප් ක්‍රමය, වර්ෂයකට රු. 1,380—20×120—රු. 3,780. එහි රු. 2,820 වැටුපට පළමු කාර්යක්ෂමතා කඩයිමක් ඇත. පත්කිරීම සඳහා තෝරාගනු ලබන අයදුම්කරු, එංගලන්තයේ පුස්තකාල සංගමයේ 1 වැනි වෘත්තීය විභාගයෙන් හෝ ලංකාවේ පුස්තකාල සංගමයේ 1 වැනි පරීක්ෂණයෙන් හෝ සමර්ථවී ඇති නම් වර්ෂයකට රු. 1,620 ක ආරම්භක වැටුපක් ගෙවනු ඇත. එම සුදුසුකම් නැතිනම් වර්ෂයකට රු. 1,380 ක ආරම්භක වැටුපක් ගෙවනු ලබන අතර, ලංකාවේ පුස්තකාල සංගමයේ ප්‍රථම වෘත්තීය පරීක්ෂණයෙන් සමත් වූ වහාම වර්ෂයකට රු. 1,620 ක වැටුපක් ගෙවනු ලැබේ.

3. තෝරා ගනු ලබන අයදුම්කරු, පත්කරනු ලබන ප්‍රාදේශීය බලමණ්ඩලයේ සීමාව තුළ වාසය කිරීමට නියම කරනු ලැබේ. තවද, පෙරවරු 7 සිට පස්වරු 8 දක්වා කඩින් කඩ වැඩ කිරීමට සහ අවශ්‍ය වූ විටක පෝය දින සහ ආණ්ඩුවේ නිවාඩු දිනයන්හි වැඩ කිරීමට ද සිදුවෙයි.

4. තෝරාගනු ලබන අයදුම්කරු මාරුකිරීමට යටත් වනු ඇත.

5. මේ ගැසට් පත්‍රයේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට 1966.11.15 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

7. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

8. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන අයදුම් පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අවසාන දිනට ප්‍රථම ලැබී ඇති බැව් සහතික කර, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින් ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

9. සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ අයදුම් පත් පමණක් ලැබුණු බැව් දන්වනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

1966 ඔක්තෝබර් මස 17 දින,
තැ. පෙ. 530, කොළඹ.

10-1056—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### ප්‍රධාන පශු ශල්‍ය වෛද්‍ය තනතුර

යථෝක්ත තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

2. වැටුප් ක්‍රමය :—වර්ෂයකට රු. 8,800—9×480—රු. 13,200කි. වර්ෂයකට රු. 11,280 ක වැටුප මත අවුරුදු දෙකක් තුළ නතර කිරීමක් ඇති අතර, වර්ෂයකට රු. 11,760 ට පළමුව කාර්යක්ෂමතා කඩ ඉමකි.

3. අවශ්‍ය සුදුසුකම් :—

(අ) වයස : 66.11.15 දිනට වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි.

(ආ) (i) අයදුම්කරුවෝ පශ්චාත් උපාධි පාඨමාලාව සම්පූර්ණ කළා වූ, ලංකා විශ්ව විද්‍යාලයේ පශු විද්‍යාව පිළිබඳ උපාධි ධාරීහු විය යුත්තෝයි ; නැතහොත්

(ii) (එංගලන්තයේ) පශු ශල්‍ය වෛද්‍යවරුන්ගේ රාජකීය විද්‍යාලයේ සාමාජිකයෝ විය යුත්තෝයි ; නැතහොත්

(iii) සමාන සුදුසුකම් ඇරිය යුත්තෝය.

අයදුම්කරුවන්ට පශු වෛද්‍ය කර්මයේ නියුක්ත වූවකු වශයෙන් යටත් පිරිසෙයින් අවුරුදු 10 ක පළපුරුද්දක් ද තිබිය යුතුය.

4. මේ ගැසට් පත්‍රයේ IV වන කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම්පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට, 66.11.15 දිනට හෝ ඊට ප්‍රථම මා වෙත ලැබෙන ලෙස එවිය යුතුය.

6. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලන ආයතනවල සේවයේ යෙදී සිටින නිළධාරීන්ගේ අයදුම්පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අවසාන දිනට පෙර ලැබුණු බවට සහතික කර, ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු ඉදිරිපත් කරමින් ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

7. සුදුසු ඉල්ලුම්කරුවන්ගේ පමණක්, ඉල්ලුම්පත්‍ර ලැබුණු බවට දන්වා එවනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

1966 ඔක්තෝබර් මස 16 වැනි දින,
කොළඹ, තැ. පෙ. 530,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

10-1057—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

## පළාත් පාලන සේවය

### II වැනි ශ්‍රේණියේ වර්ණයෝජක තනතුර—සිංහල

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි. තෝරාගනු ලබන තැනැත්තා පළමුවරට කොළඹ නගර සභාවේ නාගරික මුද්‍රණාලයට පත් කරනු ලැබේ.

2. වැටුප.—තනතුරට නියමිත වැටුප් ක්‍රමය: වර්ෂයකට රු. 1,296—42×11—රු. 1,758.

3. අවශ්‍ය සුදුසුකම් :—

(අ) වයස 1966.11.15 දිනට වයස අවුරුදු 40 ට නොවැඩිවිය යුතුය. (ප.පා. සේවයේ නොවන අයට).

(ආ) කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය ඇතිව, සිංහල වර්ණයෝජනය පිළිබඳව පිළිගත් මුද්‍රණාලයක යටත් පිරිසෙයින් අවුරුදු 5ක පළපුරුද්දක් හෝ

(ඇ) සිංහල වර්ණයෝජනය පිළිබඳව පිළිගත් මුද්‍රණාලයක අවුරුදු 10 කට නොඅඩු පළපුරුද්දක්.

4. මේ ගැසට් පත්‍රයේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් අදාල වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම් පත්‍ර, පත් කිරීම සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට 1966.11.15 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුය. සඳහන් කොට ඇති ආකෘති පත්‍රයෙහි 13 වැනි ඡේදය වෙනුවට පහත සඳහන් කරුණු යොදා ගන්න :—

"13. සිංහල වර්ණයෝජනය ගැන ලබා ඇති පළපුරුද්ද ගැන විස්තර :————.

මුද්‍රණාලයේ නම, සේවය කළ කාලසීමාව, යනාදී විස්තර දක්වන්න. එය සනාථ කිරීමට සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි."

6. අයදුම් පත්‍ර හෝ ඊට අදාල අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

7. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා සවකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස් වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දිනට පෙර ලැබුණු බැව් සහතික කර, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

8. සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ අයදුම්පත් පමණක් ලැබුණු බැව් දන්වනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
සභාපති වෙනුවට.

1966 ඔක්තෝබර් මස 14 දින,
තැ. පෙ. 530—කොළඹ.

10–1078—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### කාර්යාල කාර්ය සහායක තනතුර—බෙරලපනාතර ගම්සභාව

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. වැටුප් ක්‍රමය.—වර්ෂයකට රුපියල් 540—30×8—24×1—රු. 804; රු. 636 සහ රු. 732 යන වාර්ෂික වැටුප්වලට පළමු කාර්යක්ෂමතා කඩයිම් ඇත.

3. අවශ්‍ය සුදුසුකම් :—

(අ) වයස: 1966 නොවැම්බර් 16 වැනි දිනට වයස අවුරුදු 20 ට නොඅඩු 30 ට නොවැඩි විය යුතුයි.

(ආ) අපේක්ෂකයෝ සිංහල/දෙමළ 6 වැනි ප්‍රමාණයෙන් සමත් වී සිටිය යුත්තාහ.

4. පළාත් පාලන සේවා සාමාජිකයන්ගේ හා ප්‍රාදේශීය බලමණ්ඩලවල ස්ථිර සේවයේ සිටින සේවකයන්ගේ අයදුම් පත්‍ර, ඔවුන් අනිකුත් සුදුසුකම් ලබා ඇත්නම්, වයස පිළිබඳ නියමය නොතකා සලකා බලනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයේ පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට, 1966 නොවැම්බර් 16 වැනි දිනට හෝ පළමු බෙරලපනාතර ගම්සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි.

ඩී. රත්නායක,
බෙරලපනාතර ගම්සභාවේ සභාපති.

1966 ඔක්තෝබර් මස 8 වැනි දින,
බෙරලපනාතර ගම්සභා කාර්යාලය,
ඌරුබොක්ක.

10-1338—66.10.27 දින අංක 14.719 දරන ගැසට් පත්‍රය

---

# අතුරු ව්‍යවස්ථා

ඇල්.ඩී.—බී. 16/64

## කහවත්ත සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 129(ආ) වැනි සහ 152 වැනි වගන්ති යටතේ කහවත්ත සුළු නගර සභාව විසින් පනවනු ලැබ, එකී ආඥාපනතේ 153 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා වයි.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966 සැප්තැම්බර් මස 20 දින.
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථාව

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 129 (ආ) වැනි වගන්තිය යටතේ අය කරනු ලබන, 1965 දෙසැම්බර් මස 3 වැනි දින අංක 14,576 දරන ගැසට් පත්‍රයේ පළවූ 1965 නොවැම්බර් මස 22 වැනි දින දරන දැන්වීමෙහි සඳහන් 1966 වර්ෂය සඳහාවූ කසල ශෝධනය පිළිබඳ විශේෂ වරිපනම් බද්දෙන් මීට යාකොට ඇති උපලේඛනයේ විස්තර කරන දේපල නිදහස් කළ යුතුය.

### උපලේඛනය

පහත සඳහන් වරිපනම් අංක දරන දේපල :—

#### අංක 1 දරණ ඡන්ද කොට්ඨාශය

1/1, 1/2, 1/3, 1/4, 1/5, 1/6, 1/7, 1/8, 1/9, 1/10, 1/11, 1/12, 1/13 1/14, 1/15, 1/16, 1/17, 1/18, 1/19, 1/20, 1/21, 1/22, 1/23, 1/24, 1/25, 1/26, 1/27, 1/28, 1/29, 1/30, 1/31, 1/32, 1/33, 1/34, 1/35, 1/36, 1/37, 1/38, 1/39, 1/40, 1/41, 1/42, 1/43, 1/44, 1/45, 1/46, 1/47, 1/48, 1/49, 1/50, 1/51, 1/52, 1/53, 1/54, 1/55, 1/56, 1/57, 1/58, 1/59, 1/60, 1/61, 1/62, 1/63.

#### අංක 3 දරණ ඡන්ද කොට්ඨාශය

3බී/1, 3බී/2, 3බී/3, 3බී/4, 3බී/5, 3බී/6, 3බී /7, 3බී/8, 3බී/9, 3බී/10, 3බී/11, 3බී/12, 3බී/13, 3බී/14, 3බී/15, 3බී/16, 3බී/17.

#### අංක 4 දරණ ඡන්ද කොට්ඨාශය

4/1, 4/2, 4/3, 4/4, 4/5, 4/6, 4/7, 4/8, 4/9, 4/10, 4/11, 4/12, 4/13, 4/14, 4/15, 4/16, 4/17.

#### අංක 5 දරණ ඡන්ද කොට්ඨාශය

5/1, 5/2, 5/3 5/4, 5/5, 5/6, 5/7, 5/8, 5/9, 5/10, 5/11, 5/12, 5/13, 5/14, 5/15, 5/16, 5/17, 5/18, 5/19, 5/20, 5/21, 5/22, 5/23, 5/24, 5/25, 5/26, 5/27, 5/28, 5/29, 5/30, 5/31, 5/32, 5/33, 5/34, 5/35, 5/36, 5/37, 5/38, 5/39, 5/40, 5/41, 5/42, 5/43, 5/44, 5/45, 5/46, 5/47, 5/48, 5/49, 5/50, 5/51, 5/52, 5/53, 5/54, 5/55.

10–1054—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

# ආදයම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන

## තංගල්ල නගර සභාව

### 1964 අවුරුද්දේ ආදයම හා වියදම පිළිබඳ ප්‍රකාශනය

| ආදයම | මුදල | එකතුව |
|---|---|---|
| | රු. ශ. | රු. ශ. |
| ඒ. සාමාන්‍ය ආදයම ... ... | 1,16,846 13 | |
| බී. මංමාවත් ... ... | 3,880 20 | |
| සී. තානායම් හා අම්බලම් ... | 6,371 54 | |
| ඩී. නගර සභා ඉඩම් හා ගොඩනැගිලි ... | 4,712 31 | |
| ඊ. මහජන සෞඛ්‍යය ... ... | 24,525 46 | |
| ඇෆ්. මහජන විනෝදය ... ... | 5,827 05 | |
| ජී. සුසාන භූමි ... ... | 779 50 | |
| එච්. බල්ලන් ලේඛන ගත කිරීම ... | 55 00 | |
| අයි. විදුලි කාර්යාංශය ... ... | 1,54,291 63 | |
| මුලු ආදයම | | 3,17,288 82 |
| **වෙනත් ලැබීම්** | | 3,17,288 82 |
| තැන්පත් මුදල් ... ... | | 19,638 05 |
| තානායම සඳහා රජයේ ආධාර ... | | 600 0 |
| පැති කාණු සඳහා රජයේ ආධාර ... | | 4,462 50 |
| අත්තිකාරම් මුදල් ... ... | | 21,656 65 |
| පොදු වෙළඳ පොළ සඳහා ණය මුදල් | | 45,000 0 |
| සියලු ම ලැබීම් ... ... | | 4,08,646 02 |
| 1963.12.31 දින ඉතිරිව තිබූ මුදල ... | | 14,788 66 |
| | | 4,23,434 68 |
| **වියදම** | | |
| ඒ. සාමාන්‍ය වියදම් ... ... | 42,583 80 | |
| බී. මංමාවත් ... ... | 32,261 54 | |
| සී. තානායම් හා අම්බලම් ... | 5,570 82 | |
| ඩී. නගර සභා ඉඩම් හා ගොඩනැගිලි ... | 7,038 26 | |
| ඊ. මහජන සෞඛ්‍යය ... ... | 62,892 79 | |
| ඇෆ්. මහජන විනෝදය ... ... | 275 0 | |
| ජී. සුසාන භූමි ... ... | 1,315 60 | |
| එච්. බල්ලන් ලේඛන ගත කිරීම ... | 122 0 | |
| අයි. විදුලි කාර්යාංශය ... ... | 1,51,190 33 | |
| මුලු වියදම ... ... | | 3,03,250 14 |
| වෙනත් ගෙවීම් | | |
| තැන්පත් මුදල් ... ... | | 20,561 13 |
| ධීවර පාරවල් සඳහා රජයේ ආධාර ... | | 1,294 0 |
| තානායම සඳහා රජයේ ආධාර ... | | 872 27 |
| පැතිකාණු සඳහා රජයේ ආධාර ... | | 4,462 50 |
| අත්තිකාරම් මුදල් ... ... ... | | 7,558 22 |
| පොදු වෙළඳ පොළ සඳහා ණය මුදල් ... | | 32,021 55 |
| විදුලි යෝජනා ක්‍රමය සඳහා ණය මුදල් ... | | 5,890 00 |
| ක්ෂය ප්‍රමාණ සංචිත අරමුදල ... | | 15,105 23 |
| ඉතිරි කිරීමේ බැංකු ගිණුම් ... | | 1,000 0 |
| සියලුම ගෙවීම් ... ... | | 3,92,015 04 |
| 1964.12.31 දිනට ඉතිරි මුදල ... | | 31,419 64 |
| | | 4,23,434 68 |

තංගල්ල නගර සභාවේ සභාපති මෙන්ඩිස් සිංඤෝ ගලප්පත්ති වන මම, ඉහළ දැක්වෙන ප්‍රකාශණය මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1964 අවුරුද්දේ තංගල්ල නගර සභාවට ලැබුණ හා ගෙවූ මුදල් පිළිබඳ සත්‍යවූත් නිවැරදිවූත් ප්‍රකාශණයක් බව මෙයින් කියා සිටිමි.

එම්. එස්. ගලප්පත්ති,
සභාපති.

නිවැරදි බවට සහතික කරමි.
සහික, රේ. ධ. අ. සමරජීව.

1966.2.2 දින තංගල්ලේ දී මා ඉදිරිපිට ප්‍රකාශ කළ බවට.

ඒ. ඇස්. පී. අප්පුසිංඤෝ,
සමාදාන විනිශ්චයකාර.

## තංගල්ල නගර සභාව

### 1964.12.31 දිනට වත්කම් හා වගකීම් පිළිබඳ ප්‍රකාශනය

| වගකීම් | | රු. ශ. |
|---|---|---|
| තැන්පත් මුදල් ... ... | | 33,296 58 |
| ණය මුදල් ... ... | | |
| නිවාස යෝජනා ක්‍රමය ... | | 920 07 |
| විදුලි යෝජනා ක්‍රමය ... | | 12,701 72 |
| පොදු වෙළඳ සැල ... ... | | 12,978 45 |
| ක්ෂය ප්‍රමාණ සංචිත අරමුදල—විදුලි අංශය | | 894 77 |
| | | 60,791 59 |
| **වත්කම්** | | |
| අත්තිකාරම් මුදල් ... ... | | 4,545 70 |
| ඉතිරිකිරීමේ බැංකු ගිණුම් ... | | 1,500 0 |
| මුදල් ගිණුම— | | |
| හම්බන්තොට කච්චේරියේ මුදල් ශේෂය ... | 21,030 82 | |
| ලංකා බැංකුවේ ශේෂය ... | 14,166 33 | |
| සුලු ගෙවීම් සඳහා මුදල් ලිපිකරු අත මුදල | 100 0 | |
| | 35,297 15 | |
| හර කර නැති චැක්පත්වල මුදල අඩුකොට | 19,471 72 | |
| | 15,825 43 | |
| බැංකුවට යවා අති බැරකර නැති මුදල ... | 15,543 97 | |
| | 31,369 40 | |
| මුදල් පොතේ පෙන්වා නැති බැංකු ගාස්තු ආදිය ... ... | 50 24 | |
| | | 31,419 64 |
| අධිකතා හා ඌනතා ගිණුම— | | |
| 63.12.31 දිනට ඌනතාවය ... | 37,364 93 | |
| 1964 දී අධිකතාවය අඩුකොට— | | |
| ආදයම ... 3,17,288 82 | | |
| වියදම ... 3,03,250 14 | | |
| අධිකතාවය ... | 14,038 68 | |
| 64.12.31 දිනට සමමුච්චිත ඌනතාවය | | 23,326 25 |
| | | 60,791 59 |

තංගල්ල නගර සභාවේ සභාපති මෙන්ඩිස් සිංඤෝ ගලප්පත්ති වන මම, ඉහළ දැක්වෙන ප්‍රකාශණය මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1964.12.31 දිනට තිබුණ තංගල්ල නගර සභාවේ වගකීම් හා වත්කම් පිළිබඳ සත්‍යවූත් නිවැරදිවූත් ප්‍රකාශණයක් බව මෙයින් කියා සිටිමි.

එම්. එස්. ගලප්පත්ති.
සභාපති.

නිවැරදි බවට සහතික කරමි.

සහික. රේ. ධ. ඇ. සමරජීව.

1966.2.2 දින තංගල්ලේදී මා ඉදිරිපිට ප්‍රකාශ කළ බවට,

ඒ. ඇස්. පී. අප්පුසිංඤෝ,
සමාදාන විනිශ්චයකාර...

## අය-වැය ලේඛන

### බෙන්තොට සුළු නගර සභාව

**මුදල් රෙගුලාසි අංක 40 (II) යටතේ ඉල්ලුම් පත්‍රය**

අයවැය ලේඛණය—1966

26.8.66 වැනි දින පැවැත්වූ සුළු නගර සභා රැස්වීමේදී, පළාත් පාලන සහකාර කොමසාරිස්තුමාගේ අනුමැතියට යටත්ව, සම්මත කර ගන්නා ලද පහත සඳහන් වැඩිපුර වැය ශීර්ෂයන් පිරවීම සඳහා වෙනත් ඉතිරි වැය ශීර්ෂයෝ :—

**ඉතිරි**

| | | රු. | ශ. |
|---|---|---|---|
| ඒ 1 ඒ. | වැටුප්—ලේකම් ... ... ... | 650 | 0 |
| ඒ 1 ජී. | ජීවනාධාර ... ... ... | 550 | 0 |
| ඒ 2 ඒ. | දීමනා ... ... ... | 100 | 0 |
| බී 1 බී. | මංමාවත්-ඕවර්සියර් වැටුප් ... ... | 150 | 0 |
| බී 1 සී. | මංමාවත්—කම්කරු වැටුප් ... ... | 700 | 0 |
| බී 13 | මංමාවත්—ජීවනාධාර ... ... | 350 | 0 |
| ඩී 1 ඇන්. | මාතෘදරකාභිවෘධි මධ්‍යස්ථානය ... | 250 | 0 |
| ඩී 2 ඊ. | කසළ ශෝධන—ජීවනාධාර ... ... | 60 | 0 |
| ජේ 3 | පුස්තකාල—පොත්පත් ... ... | 600 | 0 |
| ජේ 4 | පුස්තකාල—ලී බඩු ... ... | 399 | 0 |
| | | 3,809 | 0 |

**වැඩිපුර**

| | | රු. | ශ. |
|---|---|---|---|
| ඒ 1 බී. | ලිපිකරු වැටුප් ... ... | 1 | 0 |
| ඒ 1 ඩී. | කා. කා. සහායක—වැටුප් ... ... | 8 | 0 |
| ඒ 2 බී. | ගමන් ගාස්තු ... ... | 100 | 0 |
| ඒ 2 සී. | අයකැමි කම්වු මිල ... ... | 700 | 0 |
| ඒ 2 ඇප්. | ලිපි ද්‍රව්‍ය ... ... ... | 650 | 0 |
| ඒ 2 කේ. | කාර්යාලීය උපකරණ ... ... | 1,700 | 0 |
| ඒ 2 ජී. | වාහන තහඩු ... ... ... | 250 | 0 |
| ඒ 4 | ආධාර හා දීමනා ... ... | 200 | 0 |
| ඩී 5 එච්. | නාන ළිං ... ... ... | 200 | 0 |
| | | 3,809 | 0 |

1966 සැප්තැම්බර් 3 වැනි දින,
සුළු නගර සභා කාර්යාලය,
බෙන්තොට.

චන්ද්‍රරත්න කොලොන්නෙ,
සභාපති,
බෙන්තොට සුළු නගර සභාව.

අනුමත කරමි.

පර්සි අබේසිංහ,
සහකාර පළාත් පාලන කොමසාරිස්,
ගාල්ල දකුණ ඉහල.

1966 ඔක්තෝම්බර් 14 වැනි දින,
ගාල්ලේ පළාත් පාලන කාර්යාලයේ දී ය.

10-1071—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

---

### කඳන සුළු නගර සභාව

**සුළු නගර සභා මුදල් රෙගුලාසි අංක 40 (II) යටතේ කෙරෙන ඉල්ලීමයි**

1966 අය වැය ලේඛනය

1966 වර්ෂයේ අය වැය ලේඛනයේ මුදල් ඉතිරි වේයයි ගණන් බලා ඇති වැය ශීර්ෂයන්ගෙන් වැය ඉක්මවා යන ශීර්ෂයන්ට මෙහි පහත දක්වෙන පරිදි මුදල් මාරු කිරීමට 1966 අගෝස්තු මස 28 වෙනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේදී අංක 5 දරණ තීරණයෙන් සභා සම්මත විය.

**ශේෂව ඇති මුදල්**

| | | රු. | ශ. |
|---|---|---|---|
| ඒ 1 ඒ. | ලේකම් ... ... ... | 1,100 | 0 |
| ඒ 1 ඩී. | පියන්වරු ... ... ... | 1,300 | 0 |
| ඒ 2 බී. | ගමන් ගාස්තු ... ... ... | 800 | 0 |
| ඒ 2 සී. | බදු අයකරන්නන් සඳහා කොමිස් ... ... | 5,000 | 0 |
| ඒ 2 ඊ. | නීතියේ කටයුතු සඳහා ... ... | 750 | 0 |
| ඒ 2 ජී. | කරත්ත හා බෝට්ටු තහඩු ... ... | 2,000 | 0 |
| ඒ 4 | ආධාර හා දීමනා ... ... ... | 500 | 0 |
| බී 3 | යන්ත්‍ර හා ආයුධ ... ... ... | 225 | 0 |
| බී 11 | මැනීම් ... ... ... | 250 | 0 |
| ඩී 1 ජී. | උපකරණ හා බෙහෙත් ... ... | 1,500 | 0 |
| ඩී 5 සී. | නඩත්තු කිරීම ... ... ... | 3,500 | 0 |
| ඩී 5 ඩී. | අත්පත් කර ගැනීම් ... ... | 1,000 | 0 |
| ඩී 5 ඊ. | ඉදිකිරීම් ... ... ... | 900 | 0 |
| ජී 1 | බල්ලන් විනාශ කිරීම ... ... | 200 | 0 |
| | | 19,025 | 0 |

**වැඩිපුර අවශ්‍යවන මුදල්**

| | | රු. | ශ. |
|---|---|---|---|
| ඒ 2 ඒ. | ආධාර ... ... ... | 1,500 | 0 |
| ඒ 2 එප්. | ලිපි ද්‍රව්‍ය ආදිය ... ... ... | 1,000 | 0 |
| ඒ 2 ජේ. | හදිසි වියදම් ... ... ... | 400 | 0 |
| බී 7 | අත්පත් කර ගැනීම ... ... | 400 | 0 |
| බී 8 | සංස්කරණය ... ... ... | 5,000 | 0 |
| සී 1 | වේතන ... ... ... | 100 | 0 |
| ඩී 1 එන්. | මාතෘ නිවාසය ... ... ... | 1,750 | 0 |
| ඩී 2 ඒ. | වේතන ... ... ... | 500 | 0 |
| ඩී 3 ඒ. | වේතන ... ... ... | 500 | 0 |
| ඩී 3 ජී. | ඉදිකිරීම් ... ... ... | 725 | 0 |
| ඩී 7 ඩී. | ඉදිකිරීම් ... ... ... | 5,000 | 0 |
| අයි 1 | ගිණි නාශක බඳුන් ... ... | 150 | 0 |
| ජේ 3 | පොත් පත් හා සඟරා ... ... | 2,000 | 0 |
| | | 19,025 | 0 |

1966 සැප්තැම්බර් මස 8 වෙනි දින,
කඳාන සුළු නගර සභා කාර්යාලයේදීය.

ජෙරාඩ් බී. හල්පෙ,
සභාපති.
සුළු නගර සභාව, කඳාන.

අනුමත කරමි.

පළාත් පාලන සහකාර කොමසාරිස් (බටහිර කොටස).

1966 ඔක්තෝබර් මස 17 වැනි දින,
බම්බලපිටියේ දී ය.

10-1034—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

## දෙවිනුවර සුළු නගර සභාව

**අංක 40 (II) දරණ සුළු නගර සභා මුදල් රෙගුලාසි යටතේ කරන ඉල්ලීමයි**

**අය වැය ලේඛණය—1966**

| ඉතිරි වැය | රු. ශ. | අතිරේක වැය | රු. ශ. |
|---|---|---|---|
| සී.—සභා ගොඩනැගිලි සහ ඉඩම් : | | බී.—මංමාවත් : | |
| (I) වැටුප් ... ... ... | 200 0 | (II) මැනීම් ගාස්තු ... ... ... | 200 0 |
| | 200 0 | | 200 0 |

1966 ක්වූ මැයි මස 31 වෙනි දින පවත්වන ලද සභා රැස්වීමේ අංක 8 දරණ යෝජනාවෙන් සභා සම්මත විය.

ඩී. ජී. බෙබිසිංහෝ,
සභාපති,
දෙවිනුවර සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
දෙවිනුවර, 1966 ඔක්තෝබර් මස 17 වැනි දින.

10-1032/1—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

---

## දෙවිනුවර සුළු නගර සභාව

**අංක 40 (II) දරණ සුළු නගර සභා මුදල් රෙගුලාසි යටතේ කෙරෙන ඉල්ලීමයි**

**අය වැය ලේඛණය—1966**

| ඉතිරි වැය | රු. ශ. | අතිරේක වැය | රු. ශ. |
|---|---|---|---|
| බී.—මංමාවත් : | | බී.—මංමාවත් : | |
| (1) වැටුප් ... ... ... | 110 0 | (7) ආඥාපණත යටතේ ඉඩම් ලබාගැනීම ... ... | 110 0 |
| (බී) පරීක්ෂක ... ... | | | |
| | 110 0 | | 110 0 |

1966 ක්වූ ජූනි මස 30 වෙනි දින පවත්වන ලද සභා රැස්වීමේ අංක 2 දරණ යෝජනාවෙන් සභා සම්මත විය.

ඩී. ජී. බෙබිසිංහෝ,
සභාපති,
දෙවිනුවර සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
දෙවිනුවර, 1966 ඔක්තෝබර් මස 17 වැනි දින.

## දෙවිනුවර සුළු නගර සභාව

**අංක 40 (II) දරණ සුළු නගර සභා මුදල් රෙගුලාසි යටතේ කෙරෙන ඉල්ලීමයි**

**අය වැය ලේඛණය—1966**

| ඉතිරි වැය | රු. ශ. | අතිරේක වැය | රු. ශ. |
|---|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් : | | ඒ.—සාමාන්‍ය වියදම් : | |
| 1. නිළධාරීන්ගේ වැටුප්— ... ... | 80 0 | 2. කාර්යාල වියදම්— ... ... ... | 80 0 |
| (බී) ලිපිකරු මණ්ඩලය ... | | (ඇම්) නිළ ඇඳුම් | |
| | 80 0 | | 80 0 |

**විදුලිය අංශය**

| | | | |
|---|---|---|---|
| ඊ.—ඩී. 4 පාලනය සහ සාමාන්‍ය වියදම්— ... ... | 593 0 | ඊ.—ඩී. 4 පාලනය සහ සාමාන්‍ය වියදම්— | |
| (ඩී) විවිධ ... | | (ඒ) පාලන අංශයේ වැටුප් දීමනා ... ... | 413 0 |
| | | ඊ.—ඩී. 10 ජීවනාධාර ... ... ... | 180 0 |
| | 593 0 | | 593 0 |

1966 ක්වූ ජූලි මස 30 වෙනි දින පවත්වන ලද සභා රැස්වීමේ අංක 4 දරණ යෝජනාවෙන් සභා සම්මත විය.

ඩී. ජී. බෙබිසිංහෝ,
සභාපති,
දෙවිනුවර සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
දෙවිනුවර, 1966 ඔක්තෝබර් මස 17 වැනි දින.

10-1032/2—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

## දෙවිනුවර සුළු නගර සභාව

අංක 40 (II) දරණ සුළු නගර සභා මුදල් රෙගුලාසි යටතේ කෙරෙන ඉ ප්ලිමයි

1966—අය වැය ලේඛණය

| ඉතිරි වැය | රු. ශ. | අතිරේක වැය | රු. ශ. |
|---|---|---|---|
| බී.—මංමාවත් : | | බී.—මංමාවත් : | |
| 2. නඩත්තුව ... ... ... | 125 0 | 11. මැනීම් ගාස්තු ... ... ... | 125 0 |
| | 125 0 | | 125 0 |

1966 ක්වූ ජූලි මස 30 වෙනි දින පවත්වන ලද සභා රැස්වීමේ අංක 12 දරණ යෝජනාවෙන් සභා සම්මත විය.

ඩී. ජී. බෙබිසිංඤෝ,
සභාපති,
දෙවිනුවර සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
දෙවිනුවර, 1966 ඔක්තෝබර් මස 17 වැනි දින.

## දෙවිනුවර සුළු නගර සභාව

අංක 40 (II) දරණ සුළු නගර සභා මුදල් රෙගුලාසි යටතේ කෙරෙන ඉ ප්ලිමයි

1966—අය වැය ලේඛනය

| ඉතිරි වැය | රු. ශ. | අතිරේක වැය | රු. ශ. |
|---|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් : | | ඒ.—සාමාන්‍ය වියදම් : | |
| 1. නිළධාරීන්ගේ වැටුප්— | | 1. නිළධාරීන්ගේ වැටුප්— | |
| (බී) ලිපිකරු මණ්ඩලය ... ... ... | 476 0 | (ඒ) ලේකම් ... ... ... | 86 0 |
| | | බී.—මහජන සෞඛ්‍ය : | |
| | | 3. වැසිකිළි ශෝධක— | |
| | | (බී) කරත්ත, ගොන් සහ ලොරි ... ... | 390 0 |
| | 476 0 | | 476 0 |

වර්ෂ 1966 ක්වූ අගෝස්තු මස 30 වෙනි දින පවත්වන ලද සභා රැස්වීමේ අංක 7 දරණ යෝජනාවෙන් සභා සම්මත විය.

ඩී. ජී. බෙබිසිංඤෝ,
සභාපති,
දෙවිනුවර සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
දෙවිනුවර, 1966 ඔක්තෝබර් මස 17 වැනි දින.

10–1032/3—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

---

## දෙවිනුවර සුළු නගර සභාව

1966 වර්ෂයේ පළමුවැනි පරිපූරක අය වැය ලේඛනය

| | රු. ශ. |
|---|---|
| බී.—මංමාවත්— | |
| (2) නඩත්තුව ... ... ... | 2,500 0 |

වර්ෂ 1966 ක්වූ ජූනි මස 11 වෙනි දින පවත්වන ලද විශේෂ සභා රැස්වීමේ අංක 1 දරණ යෝජනාවෙන් සභා සම්මත විය.

ඩී. ජී. බෙබී සිංඤෝ,
සභාපති,
දෙවිනුවර සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
දෙවිනුවර, 1966.10.18

## දෙවිනුවර සුළු නගර සභාව

1966 වර්ෂයේ දෙවැනි පරිපූරක අය වැය ලේඛනය

| | රු. ශ. |
|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම— | |
| (2) එජ්, ලිපි ද්‍රව්‍ය, මුද්‍රණ දැන්වීම් හා මුද්දර ... | 219 0 |

වර්ෂ 1966 ක්වූ ජූනි මස 30 වෙනි දින පවත්වන ලද සභා රැස්වීමේ අංක 8 දරණ යෝජනාවෙන් සභා සම්මත විය.

ඩී. ජී. බෙබී සිංඤෝ,
සභාපති,
දෙවිනුවර සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
දෙවිනුවර.
1966 ඔක්තෝබර් මස 18 වැනි දින.

## දෙවිනුවර සුළු නගර සභාව

1966 වර්ෂයේ තුන්වන පරිපූරක අය වැය ලේඛනය

| | රු. ශ. |
|---|---|
| විදුලි අංශය— | |
| ඊඩී 4.—පාලන හා සාමාන්‍ය වියදම් | |
| (ඩී) විවිධ ... ... ... | 161 80 |
| ඊඩී 10.—ජීවනාධාර ... ... ... | 152 0 |
| | 313 80 |

වර්ෂ 1966ක්වූ ජූලි මස 30 වෙනි දින අංක 3 දරණ යෝජනාවෙන් සභා සම්මත විය.

ඩී ජී. බෙබී සිංඤෝ,
සභාපති,
දෙවිනුවර සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
දෙවිනුවර.
1966 ඔක්තෝබර් මස 18 වෙනි දින.

10–1031—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

## පුස්සැල්ලාව සුළු නගර සභාව

### සුළු නගර සභා මුදල් රෙගුලාසි අංක 40 (ii) දරණ කොටස යටතේ අයදුම්පත

### වර්ෂ 1966 අය වැය ලේඛනය

1966 අය වැය ලේඛනයේ ඒ ඒ ශීර්ෂ යටතේ වෙන්කරන ලද මුදල් වලින් ඉතිරි වේයයි ගණන් බලනු ලද පහත දක්වෙන ශීර්ෂ යටතේ මුදල් ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂ වලට මාරුකර අවශ්‍ය වී තිබෙන අතිරේක වැය සඳහා එම ශීර්ෂ යටතේ යෙදීමට 1966 ක්වූ සැප්තැම්බර් මස 30 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ අංක 21 දරණ සම්මුතියෙන් සභා සම්මත විය.

#### I වැනි කොටස—සාමාන්‍ය

ඉතිරි මුදල් වැය ශීර්ෂය

| | | රු. | ශ. |
|---|---|---|---|
| ඒ 1 (බී) | ලිපිකරුවන් ... ... | 100 | 0 |
| ඒ 1 (ඩී) | පියන්වරු (කාර්යාල කාර්ය සහායකවරු) ... | 80 | 0 |
| ඒ 1 (ඇප්) | විශ්‍රාම වැටුප් ... ... | 50 | 0 |
| ඒ 2 (බී) | ගමන්ගාස්තු... ... ... | 300 | 0 |
| ඒ 2 (ඊ) | නීතියේ කටයුතු සඳහා ... ... | 200 | 0 |
| ඒ 2 (ජේ) | හදිසි වියදම් ... ... | 200 | 0 |
| ඩී 1 (ඩී) | නිලඇඳුම් ... ... ... | 85 | 0 |
| ඩී 1 (ඊ) | මුද්‍රණ ... ... ... | 75 | 0 |
| ඩී 1 (ඇප්) | විශබීජ නාශක ද්‍රව්‍ය ... ... | 250 | 0 |
| ඩී 1 (ඇන්) | මාතෘ නිවාසය හා දරකාහිවෘඩි නිවාසය ... | 1,600 | 0 |
| ඩී 3 (බී) | කරත්ත, ගොනුන් හා ලොරි ... ... | 400 | 0 |
| ඩී 3 (ජී) | ඉදිකිරීම ... ... ... | 600 | 0 |
| ඩී 4 (සී) | අත්පත්කර ගැනීම ... ... | 150 | 0 |
| ඩී 5 (බී) | උපකරණ ... ... ... | 175 | 0 |
| ඩී 5 (සී) | නඩත්තුකිරීම ... ... | 500 | 0 |
| ඩී 7 (ඒ) | වේතන ... ... ... | 400 | 0 |
| ඊ 8 | පිළිගැනීම් උත්සව ... ... | 240 | 0 |
| ඇප් 2 | නඩත්තුකිරීම ... ... | 100 | 0 |
| | | 5,505 | 0 |

වැඩිපුර වියදම් වැය ශීර්ෂය

| | | රු. | ශ. |
|---|---|---|---|
| ඒ 1 (සී) | ආදයම් පරීක්ෂකයින් ... ... | 375 | 0 |
| ඒ 1 (ජී) | ජීවන හා විශේෂ ජීවනආධාර ... | 350 | 0 |
| ඒ 2 (ඇප්) | ලිපිද්‍රව්‍ය, මුද්‍රණය, ප්‍රසිද්ධ කිරීම් හා මුද්දර ... | 2,250 | 0 |
| ඒ 2 (අයි) | නිවාඩු දුම්රිය ප්‍රවේශපත්‍ර ... ... | 250 | 0 |
| ඒ 2 (කේ) | කාර්යාල ලී බඩු හා උපකරන ... | 400 | 0 |
| සී 4 | නඩත්තුකිරීම ... ... | 900 | 0 |
| ඩී 1 (ඒ) 1 | සෞඛ්‍ය පරීක්ෂක ... ... | 170 | 0 |
| ඩී 1 (එච්) | කාණු ඉදිකිරීම ... ... | 250 | 0 |
| ඩී 1 (ඕ) | ජීවන හා විශේෂ ජීවන ආධාර ... | 160 | 0 |
| ඩී 5 (ඩී) | අත්පත්කර ගැනීම ... ... | 250 | 0 |
| ඩී 7 (බී) | නඩත්තුකිරීම ... ... | 100 | 0 |
| ඊ 2 | නඩත්තුකිරීම ... ... | 50 | 0 |
| | | 5,505 | 0 |

#### II වැනි කොටස—විදුලි අංශය

| | රු. | ශ. |
|---|---|---|
| 4. (බී) සංචාරක සේවක වේතන හා ආධාර ... | 310 | 0 |
| | 310 | 0 |

| | රු. | ශ. |
|---|---|---|
| 1. (ඩී) විදුලි බලය මිලයට ගැනීම ... ... | 250 | 0 |
| 2. (සී) මාපක යන්ත්‍ර, ඇණ හා අනෙක් උපකරණ ... | 60 | 0 |
| | 310 | 0 |

ඒ. ඩී. ඩබ්ලිව්. පෙරේරා,
සභාපති,
පුස්සැල්ලාව සුළු නගර සභාව.

1966 ක්වූ ඔක්තෝබර් මස 16 වැනි දින,
පුස්සැල්ලාව සුළු නගර සභා කාර්යාලයේ දී ය.

10–1043—66.10.27 දින අංක 14,719 දරණ ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

## බලන්ගොඩ නගර සභාව

### ජලභීතිකා රෝගය

බලන්ගොඩ නගර සභා සීමාව තුළ ජලභීතිකා රෝග උවදුර පවතින බැවින්, එම නගර සීමාව තුළ පිහිටි පෞද්ගලික ගොඩ නැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක නොවන්නාවූ අන්‍ය ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක හමුවන දඩාවතේ යන නැතහොත් බැඳ නො තබන ලද්දාවූ හෝ දක්කාගෙන නොයනු ලබන්නාවූ කිසියම් සුනඛ යෙකු (බල්ලකු හෝ බැල්ලියකු) මා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයෙකු විසින් එවේලෙහිම විනාශ කරනු ලබන බව (ලංකාවේ ව්‍යවස්ථාපිත ප්‍රඥප්ති සංග්‍රහයේ 476 වෙනි පරිච්ඡේදය වන) ජල භීතිකා ආඥාපනතේ 11 වෙනි වගන්තියේ ප්‍රකාර මෙයින් ප්‍රකාශනය කරනු ලැබේ.

මෙම ප්‍රකාශනය 1966 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා වලංගුවේ.

ඇම්. ඇල්. ඇම්. අබුසාලි,
සභාපති,
බලන්ගොඩ නගර සභාව.

1966 ඔක්තෝබර් මස 14 වෙනි දින,
බලන්ගොඩ නගර සභා කාර්යාලයේ දීය.

7–1062—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

---

## නාංගල්ල නගර සභාව

### 1967 වර්ෂයට දේපළ බද්ද

නගර සභා ආඥාපනතේ (255 වැනි අධිකාරය) 160 වගන්තිය යටතේ, ඉකුත් වූ වර්ෂයට බල පැවැත්වුණු පහත සඳහන් දේපළ බදු, 1967 වර්ෂයටද එලෙසම පැනවීමට නාංගල්ල නගර සභාව තීරණය කර ඇති බව තත් නගර සභාව විසින් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

160 (3) වගන්තිය ප්‍රකාර, පිළිවෙළින් මාර්තු 31 දසින්, ජූනි 30 දසින්, සැප්තැම්බර් 30 දසින් හා දෙසැම්බර් 31 දසින් අවසන් වන අයුරු ත්‍රෛමාසික වශයෙන් ගෙවිය හැකි වන, මෙම නගර සභා සීමාව තුළ පිහිටා තිබෙන සියළුම නිශ්චල දේපළවල වාර්ෂික වටිනාකමින් සියයට නවය (9) බැගින් වූ වාර්ෂික බද්දක්.

එම්. එස්. ගලප්පත්ති,
සභාපති,
නාංගල්ල නගර සභාව.

1966.10.18 දින,
නාංගල්ල නගර සභා කාර්යාලයේ දීය.

7–1040—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

## තිස්සමහාරාම නගරය

### 1967 වර්ෂයට දේපල බද්ද

තිස්සමහාරාම නගරය පාලනය කරන විශේෂ කොමසාරිස්, 256 අධිකාරිය වන සුළු නගර සභා ආඥාපනතේ 159 (1) ඡේදය යටතේ 1966 වර්ෂයට පනවන ලද දේපල බද්ද ලෙසම පහත පෙනෙන ලෙස 1967 වර්ෂයට පැන වූ බව ප්‍රකාශයට පත් කරනු ලැබේ.

තිස්සමහාරාම නගර සීමාව තුළ පිහිටි සියලුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකම සියයට හත බැගින් වූ බද්ද පිළිවෙළින් ජූනි 30 හා දෙසැම්බර් 31 වෙනිදායින් අවසන් වන අයුරු සමාන කොටස් දෙකකින් ගෙවිය හැක.

එච්. ඒ. පී. අභයවර්ධන,
විශේෂ කොමසාරිස්,
තිස්සමහාරාම නගරය.

විශේෂ කොමසාරිස් කායාීලය,
තිස්සමහාරාම නගරය,
තිස්සමහාරාම, 1966.10.17.

10–1041/1—66.10.27 දින අංක 14,719 දරණ ගැසට් පත්‍රය

---

## තිස්සමහාරාම නගරය

### 1967 වර්ෂයේ සුනඛයින් ලියාපදිංචිකිරීමේ ගාස්තු

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 477 වැනි අධිකාරයේ 4 වැනි වගන්තිය ප්‍රකාර තිස්සමහාරාම සුළු නගර සභා සීමාව තුළ තබාගෙන සිටින සෑම බල්ලෙකුට රුපියල් එකක් (රු. 1) බැගින් ද, සෑම බැල්ලියකට රුපියල් එකයි ශත පණහක් (රු. 1.50) බැගින් ද 1967 මාර්තු 31 වැනිදාට හෝ ඊට ප්‍රථම ගෙවන අයුරින් ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් 1967 වර්ෂයට පනවා ඇති බව තිස්සමහාරාම නගරය පාලනය කරන විශේෂ කොමසාරිස් විසින් ප්‍රකාශනයට පත් කරනු ලැබේ.

එච්. ඒ. පී. අභයවර්ධන,
විශේෂ කොමසාරිස්,
තිස්සමහාරාම නගරය.

විශේෂ කොමසාරිස් කායාීලය,
තිස්සමහාරාම නගරය,
තිස්සමහාරාමය,
1967 ඔක්තෝබර් මස 17 දින.

10–1041/2—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

---

## තිස්සමහාරාම නගරය

### 1967 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බද්ද

තිස්ස නගරය පාලනය කරන විශේෂ කොමසාරිස් විසින්, 256 වෙනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපනත යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ—

(1) 256 වෙනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපනතේ අංක 161 දරණ වගන්තිය යටතේ පහත උපලේඛනයේ විස්තර වන ගණන් අනුව, 1967 අවුරුද්දට රථවාහන හා සතුන් සඳහා බද්දක් පනවා අයකිරීමටද,

(2) එකී ආඥාපනතේ 162 (3) වගන්තිය යටතේ එකී බදු 1967 මාර්තු මස 31 වැනිදාට හෝ ඊට ප්‍රථම ගෙවිය හැකි අයුරින් දවේ.

#### උපලේඛනය

| | රු. ශ. |
|---|---|
| මෝටර්කාර්, රෝදත්‍රයේ මෝටර්කාර්, ලොරි, මෝටර් පා පැදි, කරත්ත, අත් කරත්ත, රික්ෂෝ රථ, පා පැදි, රෝදත්‍රයේ පා පැදි හැර වෙන ඕනෑම අන් දමේ වාහන යක් සඳහා ... ... ... | 5 0 |
| සෑම පාපැදියක්, රෝදත්‍රයේ පාපැදියක්, හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් හෝ රෝදත්‍රයේ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක්— | |
| (අ) වෙළඳාම පිණිස පාවිච්චි කෙරේ නම් ... | 3 0 |
| (ආ) වෙළඳාම හැර වෙන කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම් ... ... ... | 1 0 |
| ඕනෑම අන් දමක ගොන් දෙන්නා බැඳි සෑම බර කරත්ත යක් සඳහා ... ... ... | 4 0 |
| තනි ගොනා බැඳි සෑම බරබාගයක් හෝ තිරික්කලයක් සඳහා ... ... ... | 2 50 |
| සෑම අත්කරත්තයක් සඳහා ... ... | 2 50 |
| සෑම ජින්රික්ෂෝ රථයක් සඳහා ... ... | 2 50 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ අශ්ව රථයක් සඳහා | 5 0 |
| සෑම ගොනෙක් හෝ බූරුවෙක් සඳහා ... ... | 1 0 |

එච්. ඒ. පී. අභයවර්ධන,
විශේෂ කොමසාරිස්,
තිස්සමහාරාම නගරය.

විශේෂ කොමසාරිස් කායාීලය,
තිස්සමහාරාම නගරය,
තිස්සමහාරාම, 1966.10.17.

10–1041/3—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

---

## අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාව

### 1967 වර්ෂයේ වරිපනම් බද්ද

### පළාත් ආණ්ඩු සභා ආඥාපනතේ (255 වෙනි අධිකාරය)

පළාත් ආණ්ඩු සභා ආඥාපනතේ (255 වෙනි අධිකාරය) 160 (3) වෙනි වගන්තිය යටතේ මෙම ගතාවීගත යන, 1966 අවුරුද්දට අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභා සීමාව තුළ බලපාන්නාවූ පහත සඳහන් බදු එලෙසම 1967 වර්ෂය වෙනුවෙන් ද පැනවීමට වර්ෂ 1966 ක්වූ ඔක්තෝබර් මස 11 වෙනි දින පවත්වන ලද අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාවේ විශේෂ සභා රැස්වීමේ සභා සම්මත කළ බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

(අ) අවිස්සාවේල්ල නගරය තුළ තිබෙන සෑම නිශ්චල දේපලක වාර්ෂික වටිනාකමෙන් සියයට දොළහක බද්දක් 1967 වර්ෂය තුළ අයකිරීම;

(ආ) 1967 ජල පහසුකම් ඇති ප්‍රදේශවල පිහිටි දේපලවල වාර්ෂික තක්සේරුවලින් සියයට පහක විශේෂ ජල බද්දක් ගතවී යන අවුරුද්දේ මෙන් එලෙසම අය කිරීම;

(ඇ) ඉහත (අ) යටතේ සඳහන් බද්දෙන් වාර්ෂික වටිනාකමෙන් සියයට දෙකක කොටසක් සකල ශෝධක සේවය සඳහා යෙදවීමට;

සහ

(ඇ) ගතවී යන 1966 වර්ෂයේ තුබූ ඉහත සඳහන් බදු මුදල් එලෙසම 1967 මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30, සහ දෙසැම්බර් 31, යන දිනයන්හි සමාන කොටස් හතරකට අය කිරීමද වේ.

විජේමුනි සුසිරිපාල සොයිසා,
සභාපති.
අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාව.

1966 ඔක්තෝබර් 15 වෙනි දින,
පළාත් ආණ්ඩු සභා කායාීලය,
අවිස්සාවේල්ල.

10–1027/1—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

## අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාව

**1967 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බදු**

### පළාත් ආණ්ඩු සහා ආඥාපනතේ (255 වෙනි අධිකාරය)

පළාත් ආණ්ඩු සහා ආඥාපනතේ (255 වෙනි අධිකාරය) 162 (1) (ඒ) වගන්තිය අනුව ගතවීගෙන යන අවුරුද්දේ එනම් 1966 වර්ෂයේ පනවා ඇති බදුම 1967 වර්ෂයටද එලෙසම පනවා පහත සඳහන් උපලේඛනයේ හැටියට අයකරන බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

2. පළාත් ආණ්ඩු සහා ආඥාපනතේ (255 වෙනි අධිකාරය) 163 (3) වගන්තිය යටතේ අංක 1 සඳහන් මෙම බදු 1966 මාර්තු 31 වෙනි දිනට හෝ ඊට ප්‍රථම අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභා කාර්යාලයට ගෙවිය යුතු බවද මෙයින් දැනුම් දෙනු ලැබේ.

විජේමුනි සුසිරිපාල සොයිසා,
සභාපති.
අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාව.

1966 ඔක්තෝබර් 15 වෙනි දින,
පළාත් ආණ්ඩු සභා කාර්යාලය,
අවිස්සාවේල්ල.

### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර්, විරයිසිකල්, මෝටර් ලොරි, මෝටර් බයිසිකල්, කරත්ත, අත් කරත්ත ජින් රික්ෂෝ, බයිසිකල් සහ රෝද තුනේ බයිසිකල් හැර ඕනෑම රථයකට ... | 5 | 0 |
| ඕනෑම බයිසිකලයකට හෝ රෝද තුනේ බයිසිකලයකට හෝ බයිසිකල් කාරයකට හෝ කරත්තයකට හෝ රෝද තුනේ බයිසිකල් කාරයකට හෝ කරත්තයකට— | | |
| (අ) වෙළඳ කාර්යයක් සඳහා පාවිච්චි කරන්නේ නම් ... ... | 4 | 0 |
| (ආ) වෙළඳ කාර්යයක් හැර වෙන ඕනෑම කාර්යයක් සඳහා පාවිච්චි කරන්නේ නම් ... | 1 | 0 |
| ඕනෑම ගොනුන් දෙන්නා බඳින කරත්තයක් වෙනුවෙන් ... | 4 | 0 |
| ඕනෑම අන් දමක තනි ගොනා බඳින කරත්තයක් වෙනුවෙන් ... ... | 2 | 50 |
| ඕනෑම තිරික් කලයක් වෙනුවෙන් ... ... | 3 | 0 |
| ඕනෑම අන් දමක අත් කරත්තයක් වෙනුවෙන් ... | 2 | 0 |
| ඕනෑම අන් දමක ජින් රික්ෂෝ රථයක් වෙනුවෙන් ... | 2 | 50 |
| ඕනෑම අන් දමක අශ්වයෙක්, අශ්ව පෝනියෙක් හෝ අශ්ව රථයක් වෙනුවෙන් ... ... | 5 | 0 |
| ඕනෑම අන් දමක ගොනෙක් හෝ බූරුවෙක් වෙනුවෙන් ... | 1 | 0 |

10–1027/2—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

---

## අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාව

**1967 වර්ෂයේ සුනඛ බද්ද**

### සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත—(477 වෙනි අධිකාරය)

සුනඛයින් ලියා පදිංචි කිරීමේ ආඥාපනතේ (477 වෙනි අධිකාරය) 4 වෙනි ඡේදය අනුව අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාවේ සභා සීමාව තුල තබාගෙන සිටින සෑම බල්ලෙක් හෝ බැල්ලියක් සඳහා රුපියල් 1 ක ලියා පදිංචි කිරීමේ ගාස්තුවක් පනවා ඇති බවද, එම ලියා පදිංචි කිරීමේ ගාස්තුව 1967 ක්වූ මාර්තු මස 31 වෙනි දින හෝ ඊට පෙර අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභා කාර්යාලයට ගෙවිය යුතු බවද මෙයින් දැනුම් දෙනු ලැබේ.

විජේමුනි සුසිරිපාල සොයිසා,
සභාපති,
අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාව.

1966 ඔක්තෝබර් 15 වෙනි දින,
පළාත් ආණ්ඩු සභා කාර්යාලය,
අවිස්සාවේල්ල.

10–1027/3—66.10.27 දින අංක 14,719 දරණ ගැසට් පත්‍රය

---

## නාවලපිටිය පළාත් ආණ්ඩු සභාව

**1967 සුනඛ බද්ද**

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 477 වන පරිච්ඡේදයේ 4 වන ඡේදය යටතේ නාවලපිටිය පළාත් ආණ්ඩු සභා සීමාව තුළ තබාගන්නා බල්ලෙකුගෙන් රු. 1.25 ක්ද, බැල්ලකගෙන් රු. 2.50 ක්ද, අයකරන බවද, එම බද්ද 1967 මාර්තු මස 31 වන දිනට පෙර ගෙවිය යුතු බවද මෙයින් දැනුම් දෙමි.

පී. ඒ. ඩේවිඩ් පෙරේරා,
සභාපති,
නාවලපිටිය පළාත් ආණ්ඩු සභාව.

1966 ඔක්තෝබර් මස 16 වැනි දින,
නාවලපිටිය පළාත් ආණ්ඩු සභා කාර්යාලයේදීය.

10–1061/1—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

---

## නාවලපිටිය පළාත් ආණ්ඩු සභාව

**1967 වාහන හා සත්ව බද්ද**

පළාත් ආණ්ඩු සභා ආඥාපණතේ 255 වැනි පරිච්ඡේදයේ අංක 162 දරණ වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛනය අනුව 1967 අවුරුද්දට වාහන සහ සතුන් පිළිබඳ බද්දක් පණවා ඇති බවද එම පණතේ අංක 163(3) යටතේ එම බදු 1967 මාර්තු 31 වැනි දිනට පෙර ගෙවිය යුතු බවද මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| | රු. ශ. |
|---|---|
| 1. මෝටර් කාර, මෝටර් ලොරි, මෝටර් බයිසිකල්, කරත්ත, අත් කරත්ත, ජින් රික්ෂෝ කරත්ත, බයිසිකල් සහ රෝද තුනේ බයිසිකල් හැර ඕනෑම රථයක් ... ... | 5.00 |
| 2. බයිසිකලයක්, රෝද තුනේ බයිසිකලයක්, බයිසිකල් රථයක් හෝ කරත්තයක්, හෝ රෝද තුනේ බයිසිකල් රථයක් හෝ කරත්තයක්— | |
| (අ) වෙළඳාම සඳහා යොදනු ලැබේ නම් ... | 5.00 |
| (ආ) වෙළඳාමට හැර වෙනත් දැයකට යොදනු ලැබේ නම් ... ... | 1.00 |
| 3. ගොන් දෙන්නා හෝ තනි ගොනා බැඳි කරත්තයක් හෝ තිරික්කලයක් ... ... | 3.00 |
| 4. අත් කරත්තයක් ... ... | 2.00 |
| 5. ජින් රික්ෂෝ රථයක් ... ... | 1.50 |
| 6. අශ්වයෙක්, පෝනියෙක්, කොටළුවෙක් ... | 3.00 |
| 7. ගොනෙක් හෝ බූරුවෙක් ... ... | 1.00 |

පී. ඒ. ඩේවිඩ් පෙරේරා,
සභාපති,
නාවලපිටිය පළාත් ආණ්ඩු සභාව.

1966 ඔක්තෝබර් මස 16 වැනි දින,
නාවලපිටිය පළාත් ආණ්ඩු සභා කාර්යාලයේදීය.

10–1061/2—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

## කඩුගන්නාව පළාත් ආණ්ඩු සභාව

### 1967 සුනඛ බද්ද

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 477 වන පරිච්ඡේදයේ 4 වන ඡේදයේ යටතේ කඩුගන්නාව පළාත් ආණ්ඩු සභාව සීමාව තුළ තබාගන්නා බල්ලෙකුගෙන් රු. 1.50 ක් ද, බැල්ලකගෙන් රු. 2.50 ක් ද අයකරන බවද, 1967 මාර්තු මස 31 වන දිනට පෙර ගෙවිය යුතු බවද මෙයින් දනුම් දෙමි.

ජෝර්ජ් ගුණසේකර,
සභාපති,
පළාත් ආණ්ඩු සභාව, කඩුගන්නාව.

පළාත් ආණ්ඩු සභා කාර්යාලය,
කඩුගන්නාව, 1966.10.11 දිය.

10–1059/1—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

---

## කඩුගන්නාව පළාත් ආණ්ඩු සභාව

### 1967 වර්ෂයට දේපොළ බද්ද

පළාත් ආණ්ඩු සභා ආඥාපනතේ 255 වන අධිකාරිය යටතේ මෙම ගතවී යන 1966 අවුරුද්දට බල පවත්නා පහත සඳහන් දේපොළ බදු 1967 වර්ෂයටද එලෙසම පැනවීමට කඩුගන්නාව පළාත් ආණ්ඩු සභාව තීරණයකර ඇති බව පළාත් ආණ්ඩු සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

160(3) වගන්තිය ප්‍රකාර මෙම පළාත් ආණ්ඩු සභාව තුළ පිහිටා තිබෙන සියලුම නිශ්චල දේපොළවල වාර්ෂික වටිනාකමින් සියයට දහහතරක් බැගින් ද, එකී බදු ප්‍රමාණයෙන් සියයට හයක ප්‍රමාණය වැසිකිළි බදු වශයෙන් ද, වාර්ෂික බදු පිළිවලින් මාර්තු 31 දායින්, ජූනි 30 දායින්, සැප්තැම්බර් 30 දායින්, හා දෙසැම්බර් 31 දායින් අවසන් වන අයුරු ත්‍රෛමාසික වශයෙන් ගෙවිය හැකි වේ.

ජෝර්ජ් ගුණසේකර,
සභාපති,
පළාත් ආණ්ඩු සභාව, කඩුගන්නාව.

පළාත් ආණ්ඩු සභා කාර්යාලය,
කඩුගන්නාව, 1966.10.11 දිය.

10–1059/2—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

---

## කඩුගන්නාව පළාත් ආණ්ඩු සභාව

### 1967 රථවාහන බද්ද

පළාත් ආණ්ඩු සභා ආඥාපනතේ 255 වැනි පරිච්ඡේදයේ අංක 162 දරණ වගන්තිය යටතේ පහත සඳහන් උප ලේඛනය අනුව 1967 අවුරුද්දට රථවාහන සහ සතුන් පිළිබඳ බද්දක් පනවා ඇති බවද එම පනතේ අංක 163(3) යටතේ එම බදු 1967 මාර්තු මස 31 වැනි දිනට පෙර ගෙවිය යුතු බවද මෙයින් දන්වා සිටිමි.

### උපලේඛනය

| | රු. ශ. |
|---|---|
| 1. මෝටර් කාර්, මෝටර් ලොරි, මෝටර් බයිසිකල්, කරත්ත, අත් කරත්ත, ජින් රික්ෂෝ, කරත්ත, බයිසිකල් සහ රෝද තුනේ බයිසිකල්, හැර ඕනෑම රථයක් | 5 00 |
| 2. බයිසිකලයක්, රෝද තුනේ බයිසිකලයක්, බයිසිකල් මෝටර් රථයක්, හෝ කරත්තයක් :— | |
| (අ) වෙළඳාම සඳහා යොදනු ලැබේනම් ... | 5 00 |
| (ආ) වෙළඳාමට හැර වෙනත් දෙයකට යොදනු ලැබේනම් ... ... | 1 00 |
| 3. ගොන් දෙන්නා බැඳි කරත්තයක් හෝ තිරික්කලයක් | 4 00 |
| 4. තනි ගොනා බැඳි කරත්තයක් හෝ තිරික්කලයක් | 3 00 |
| 5. අත් කරත්තයක් ... ... ... | 3 00 |
| 6. ජින් රික්ෂෝ රථයක් ... ... | 2 50 |
| 7. අශ්වයෙක්, පෝනියෙක්, කොටළුවෙක් ... | 5 00 |
| 8. ගොනෙක් හෝ බූරුවෙක් ... ... | 1 00 |

ජෝර්ජ් ගුණසේකර,
සභාපති,
පළාත් ආණ්ඩු සභාව, කඩුගන්නාව.

1966 ක්වූ ඔක්තෝබර් මස 11 වැනි දින,
කඩුගන්නාව පළාත් ආණ්ඩු සභා කාර්යාලයේදීය.

10–1059/3—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

---

## පුස්සැල්ලාව සුළු නගර සභාව

### 1967 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බද්ද

### 256 වෙනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපනත

පුස්සැල්ලාව සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත්කරනු ලබන්නේ :—

1. 256 වෙනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපනතේ අංක 161 දරණ වගන්තිය යටතේ පහත උපලේඛන්යේ විස්තර වන ගණන් අනුව, 1967 අවුරුද්දට රථවාහන හා සතුන් සඳහා බද්දක් පනවා අයකිරීමටද,

2. එකී ආඥාපනතේ 162 (3) වගන්තිය යටතේ එකී බදු 1967 මාර්තු මස 31 වෙනිදාට හෝ ඊට පෙර ගෙවිය හැකි අයුරින් ද වේ.

### උපලේඛනය

| | රු. ශ. |
|---|---|
| මෝටර් කාර්, රෝදත්‍රයේ මෝටර් කාර්, ලොරි, මෝටර් පාපැදි, කරත්ත, අත්කරත්ත, ජින් රික්ෂෝරථ, පාපැදි හෝ රෝදත්‍රයේ පාපැදි හැර වෙන ඕනෑම අන් දමේ වාහනයන් සඳහා ... ... | 5 0 |
| සෑම පාපැදියක්, රෝදත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් හෝ රෝදත්‍රයේ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් :— | |
| (අ) වෙළඳාම පිණිස පාවිච්චි කෙරේ නම් ... | 5 0 |
| (ආ) වෙළඳාමට හැර වෙන කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම් ... ... | 1 0 |
| ගොන් දෙන්නා බැඳි සෑම බරකරත්තයක් සඳහා හෝ තිරික්කලයක් සඳහා ... ... | 4 0 |
| තනි ගොනා බැඳි සෑම බරබාගයක් හෝ තිරික්කලයක් සඳහා ... ... ... | 4 0 |
| සෑම අත්කරත්තයක් සඳහා ... ... | 2 50 |
| සෑම ජින්රික්ෂෝ රථයක් සඳහා ... ... | 2 50 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ කොටළුවෙන් සඳහා | 1 0 |
| සෑම ගොනෙක් හෝ බූරුවෙක් සඳහා ... ... | 1 0 |

ඒ. සී. ඩබ්ලිව්. පෙරේරා,
සභාපති,
පුස්සැල්ලාව සුළු නගර සභාව.

1966 ඔක්තෝබර් මස 17 වැනි දින,
පුස්සැල්ලාව සුළු නගර සභා කාර්යාලයේදීය.

10–1042—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

## වතුගෙදර සුළු නගර සභාව

### 1967 වර්ෂයට වරිපනම් බදු

සුළු නගර සභා ආඥාපනත (256 පරිච්ඡේදය) යටතේ මෙම ගතවී යන වර්ෂයට බලපවත්නා පහත සඳහන් බදු එලෙසම පැනවීමට නගර සභාව මෙයින් ප්‍රකාශයට පත්කරනු ලබන්නේ 159 වැනි වගන්තිය ප්‍රකාර මෙම නගර සභා සීමාව තුළ පිහිටා තිබෙන සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට හතර (4) බැගින් වාර්ෂික බදු පිළිවෙලින් ජූනි 30 හා දෙසැම්බර් 31 වැනිදායින් අවසන්වන අයුරු කොටස් දෙකකට ගෙවිය හැකි අයුරිනි.

ඇල්. සී. ද සිල්වා,
සභාපති,
වතුගෙදර සුළු නගර සභාව.

1966 ඔක්තෝබර් මස 17 වැනි දින,
වතුගෙදර සුළු නගර සභා කාර්‍යාලයේදීය.

10–1053/1—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

---

## වතුගෙදර සුළු නගර සභාව

### 1967 වර්ෂය සඳහා සුනඛ බද්ද

### සුනඛයන් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (334 වැනි 'අධිකාරය

සුනඛයන් ලියා පදිංචි කිරීමේ ආඥාපනතේ (334 වැනි අධිකාරය) 4 වැනි වගන්තිය යටතේ මෙම සුළු නගර සභා සීමාව තුළ තබාගෙන සිටින සෑම බල්ලෙකු සඳහා රු. 1.00 ක් බැගින්ද, සෑම බැල්ලියෙකු සඳහා රුපියල් 1.50 ක් බැගින්ද, 1967 මාර්තු මස 31 වැනිදා හෝ ඊට පෙර ගෙවන අයුරින් ලියා පදිංචි කිරීමේ ගාස්තුවක් පනවා අය කිරීමට වතුගෙදර සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඇල්. සී. ද සිල්වා,
සභාපති,
වතුගෙදර සුළු නගර සභාව.

1966 ඔක්තෝබර් මස 17 වැනි දින,
වතුගෙදර සුළු නගර සභා කාර්‍යාලයේදීය.

10–1053/2—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

---

## වතුගෙදර සුළු නගර සභාව

### 1967 වර්ෂය සඳහා වැසිකිළි ශෝධන ගාස්තු

(256 වන අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 හා 156 වැනි වගන්ති යටතේ වතුගෙදර සුළු නගර සභා සීමාව තුළ වැසිකිළි ශෝධනය කෙරෙන සෑම වැසිකිළි බාල්දියක් සඳහා මසකට රුපියල් 5 ක ගාස්තුවක් පනවා අයකිරීමට එම සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඇල්. සී. ද සිල්වා,
සභාපති,
වතුගෙදර සුළු නගර සභාව.

1966 ඔක්තෝබර් මස 17 වැනි දින,
වතුගෙදර සුළු නගර සභා කාර්‍යාලයේදීය.

10–1053/3—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

---

## වතුගෙදර සුළු නගර සභාව

### 1967 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බද්ද

### 256 වැනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපනත

වතුගෙදර සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ—

(1) 256 වැනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපනතේ 161 වැනි වගන්තිය යටතේ පහත උපලේඛනයේ විස්තරවන ගණන් අනුව 1967 වර්ෂයට රථවාහන සහ සතුන් සඳහා බද්දක් පනවා අය කිරීමටද,

(2) එකී ආඥාපනතේ 162 (3) වැනි වගන්තිය යටතේ එකී බදු 1967 මාර්තු මස 31 වැනිදාට හෝ ඊට පෙර ගෙවිය හැකි අයුරින්ද වේ.

ඇල්. සී. ද සිල්වා,
සභාපති,
වතුගෙදර සුළු නගර සභාව.

1966 ඔක්තෝබර් මස 17 වැනි දින,
වතුගෙදර සුළු නගර සභා කාර්‍යාලයේදීය.

#### උපලේඛනය

| | රු. ශ. |
|---|---|
| මෝටර් කාර්, රෝදත්‍රයේ මෝටර් කාර්, ලොරි, මෝටර් පාපැදි, කරත්ත, අත්කරත්ත, රික්ෂෝ රථ පාපැදි හෝ රෝදත්‍රයේ පාපැදි හැර වෙන ඕනෑම අන්දමේ වාහනයක් සඳහා ... | 5.00 |
| සෑම පාපැදියක්, රෝදත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් නැතහොත් මෝටර් රථයක් හෝ කරත්තයක්— | |
| (අ) වෙළඳාම පිණිස පාවිච්චි කෙරේනම් ... | 5.00 |
| (ආ) වෙළඳාමට හැර වෙන කටයුතු සඳහා පාවිච්චි කෙරේනම් ... ... | 1.00 |
| ගොන් දෙදෙනා බැඳි සෑම බර කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | 4.00 |
| තනි ගොනා බැඳි සෑම බර බාගයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | 3.00 |
| සෑම අත් කරත්තයක් සඳහා ... ... | 2.50 |
| සෑම ජින්රික්ෂෝ රථයක් සඳහා ... ... | 2.50 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ කොටලුවෙක් සඳහා ... ... ... | 5.00 |
| සෑම බූරුවෙක් සඳහා ... ... | 2.50 |

10–1053/4—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

---

## පස්සර සුළු නගර සභාව

### 1967 වර්ෂයට වරිපණම් බද්ද

සුළු නගර සභා ආඥාපණත (256 වැනි අධිකාරය) යටතේ මෙම ගත වී යන අවුරුද්දට බලපවත්නා පහත සඳහන් වරිපණම් බදු 1967 වර්ෂයටද එලෙසම පැණවීමට පස්සර සුළු නගර සභාව තීරණය කර ඇති බව තත් නගර සභාව මෙයින් ප්‍රකාශණයට පත්කරනු ලැබේ.

159 වැනි වගන්තිය ප්‍රකාර මෙම නගර සභාව තුළ පිහිටා තීබෙන සියළුම නිශ්චල දේපොළවල වාර්ෂික වටිනාකමින් සියයට හය බැගින් වාර්ෂික බදු, පිලිවෙලින් මාර්තු 31 වැනිදායින්, ජූනි 30 වැනිදායින්, සැප්තැම්බර් 30 වැනිදායින් හා දෙසැම්බර් 31 වැනිදායින් අවසන්වන අයුරු ත්‍රෛමාසික වශයෙන් ගෙවිය හැකිවේ.

ඇ. පී. ඇඩ්මන්,
පස්සර සුළු නගර සභාවේ සභාපති.

1966 ක් වූ ඔක්තෝබර් මස 16 වන දින,
පස්සර සුළු නගර සභා කාර්‍යාලයේදී ය.

10–1047—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

## කඳාන සුළු නගර සභාව

### පිස්සු බලු උවදුර

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් පිළිබඳ පිස්සු බලු රෝග ආඥා පනතේ 11 වැනි වගන්තිය ප්‍රකාර (476 වැනි අධිකාරිය) කඳාන සුළු නගර සභාවේ පාලන සීමා ඇතුළත පිහිටි කිසියම් ස්ථානයක, පාරක හෝ තමන්ගේ නොවන ඕනෑම ස්ථානයක, මිදුලක හෝ ඉඩමක නිසියාකාර නොබඳින ලද එසේ නොමැති නම් භාරකරුවෙකු නොමැති බල්ලෙකු හෝ බැල්ලකු දුටු වහාම, මා විසින් ලියවිල්ලකින් දෙන ලද බලය ලත් කිසියම් පුද්ගලයෙකු විසින් එවේලේම විනාශ කර දමනු ලැබේ.

මෙම ප්‍රකාශණය 1966 ඔක්තෝබර් මස 28 දින සිට මාස 6 ක් වලංගු වන්නේය.

ජෙරාඩ් බී. හල්පෙ,
සභාපති,
කඳාන සුළු නගර සභාව.

1966 ඔක්තෝබර් මස 15 වෙනි දින,
කඳාන සුළු නගර සභා කාර්‍යාලයේදීය.

10–1065—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

---

## දැන්වීමයි

වර්ෂ 1957 අංක 59 දරන විදුලිබල (සංශෝධන) පනතින් සංශෝධිත වර්ෂ 1950 අංක 19 දරන විදුලියබල පනතේ 9 වැනි ඡේදය සහ ඒ යටතේ අංක 10,899 සහ 1956 මාර්තු 2 දින දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද රෙගුලාසින් ප්‍රකාර මා වෙත පැවරී ඇති බලය අනුව, රඹුක්කන සුළු නගර සභාවට නිකුත් කර ඇති විදුලිය බලපත්‍රයේ (අ) උපලේඛනයේ සඳහන් විදුලිය සැපයීමේ බලයලත් ප්‍රදේශය දීර්ඝ කිරීම සම්බන්ධව ඉහත සඳහන් රෙගුලාසින් යටතේ 1966 නොවැම්බර් මස 7 වැනි දින පෙරවරු 10 ට රඹුක්කන සුළු නගර සභා කාර්යාලයේදී විභාගයක් පවත්වන බව සියළු දෙනාටම මෙයින් දැනුම් දෙනු ලැබේ.

**දීර්ඝ කිරීමේ ප්‍රදේශවල මායිම් :—**

1. සුළු නගර සභා සීමාවේ සිට වගව හන්දිය ඔස්සේ කුරුණෑගල පාරේ සැතපුම් ¾ක දුර ප්‍රමාණයක් දක්වා සහ එම පාරේ මැද සිට යාර 150 බැගින් දෙපසට.
2. සුළු නගර සභා සීමාවේ සිට කෑගල්ල පාරේ සැතපුම් 1 ක දුර ප්‍රමාණයක් දක්වා සහ එම පාරේ මැද සිට යාර 150 බැගින් දෙපසට.
3. සුළු නගර සභා සීමාවේ සිට මාවනැල්ල පාරේ සැතපුම් ½ ක දුර ප්‍රමාණයක් දක්වා සහ එම පාරේ මැද සිට යාර 150 බැගින් දෙපසට.

මෙම විභාගය සම්බන්ධව කරුණු ඉදිරිපත් කිරීමට කැමති සියළුම පුද්ගලයින් පිටපත් තුනකින් සමන්විත එම කරුණු කවරයක බහා මුද්‍රා තබා ප්‍රධාන විදුලිය පරීක්ෂක තැන, තැ.පෙ. 540, කොළඹ යන ලිපිනය සඳහන් ලිපිය 1966 ඔක්තෝබර් මස 24 වැනි දින පෙරවරු 10 ට පෙර විදුලිය පරීක්ෂක තුමාගේ කාර්යාලයට බාරදිය යුතුය. නැතහොත් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

කරුණු සම්බන්ධ වැඩිමනත් විස්තර මෙම දැන්වීමේ පළමුවැනි කොටසේ සඳහන් ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද රෙගුලාසින් බලනු මැනවි.

එස්. මුරුගේසු,
විදුලිය පරීක්ෂක.

ප්‍රධාන විදුලිය පරීක්ෂක තුමාගේ කාර්යාලය,
තැ. පෙ. 540, කොළඹ,
1966 ඔක්තෝබර් 12 වැනි දින දී ය.

10–1072—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

---

## රඹුක්කන සුළු නගර සභාව

### ජල භීතිකා රෝගය

රඹුක්කන සුළු නගර සභා සීමාව තුල ජලභීතිකා රෝග උවදුර පවතින බැවින් මෙම නගර සභා සීමාව තුල පිහිටි, පෞද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක නොවන්නාවූ අන්‍ය ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක හමුවන දඩාවතේ යන නැතහොත් බැඳ නොතබන ලද්දාවූ හෝ දක්කාගෙන නොයනු ලබන්නාවූ කිසියම් සුනඛයකු (බල්ලකු හෝ බැල්ලියකු) මා විසින් ලියවිල්ලකින් බලය පවරන ලබන අයකු විසින්, විනාශ කරනු ලබන බව, (ලංකාවේ ව්‍යවස්ථාපිත ප්‍රඥප්ති සංග්‍රහයේ 476 වැනි පරිච්ඡේදය වන) ජල භීතිකා ආඥාපනතේ 11 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

මෙම ප්‍රකාශණය 1966 සැප්තැම්බර් මස 22 වැනි දින සිට 1967 මාර්තු මස 22 වැනි දින දක්වා වලංගු වේ.

මිලි කීර්තිරත්න,
සභාපතිනිය,
රඹුක්කන සුළු නගර සභාව.

1966 ඔක්තෝබර් මස 12 වන දින,
රඹුක්කන සුළු නගර සභා කාර්යාලයේදී ය.

10–1063—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

---

## බෙලිඅත්ත සුළු නගර සභාව

### 1967 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බද්ද

(256 වන අධිකාරය) සුළු නගර සභා ආඥාපනත

බෙලිඅත්ත සුළු නගර සභාව මගින් ප්‍රකාශයට පත්කරනු ලබන්නේ—

(1) (256 වන අධිකාරය) සුළු නගර සභා ආඥාපනතේ 161 දරණ වගන්තිය යටතේ, 1967 වර්ෂයට පහත උපලේඛනයේ විස්තර වන ගණන් අනුව රථවාහන හා සතුන් පිළිබඳ බද්දක් පනවා අය කිරීමද, එම ගාස්තු 1966 වර්ෂයේ බල පැවැත්වූ ගාස්තුවලට සමාන බැව්ද,

(2) එකී ආඥාපනතේ අංක 162 (3) යටතේ එකී බදු 1967 මාර්තු මස 31 වෙනිදාව හෝ ඊට පෙරාතුව ගෙවිය හැකි අයුරින්ද වේ.

ඩබ්ලිව්. පී. සයිමන් සිල්වා,
සභාපති,
බෙලිඅත්ත සුළු නගර සභාව.

සුළු නගරසභා කාර්‍යාලය,
බෙලිඅත්ත, 1966.10.15.

### උපලේඛනය

| | | රු. ශ. |
|---|---|---|
| මෝටර් කාර්, මෝටර් රෝදත්‍රයේ කාර්, ලොරි, මෝටර් පාපැදි, කරත්ත, අත්කරත්ත, රික්ෂෝරථ, පාපැදි හෝ රෝදත්‍රයේ පාපැදි හැර වෙනයම් ඕනෑම වාහනයක් සඳහා | ... | 5 0 |
| සෑම පාපැදියක්, රෝදත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් නොහොත් රෝදත්‍රයේ පාපැදියක් හෝ කරත්තයක් | | |
| (ඒ) වෙළඳාම සඳහා පාවිච්චි කෙරේ නම් | ... | 3 0 |
| (බී) වෙළඳාමට හැර වෙනත් කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම් | ... | 1 0 |
| ගොන් දෙදෙනා බැඳුන සෑම බරකරත්තයක් හෝ තිරික්කලයක් සඳහා | ... ... | 3 0 |
| තනි ගොනා බැඳුනු සෑම බරබොගයක් සඳහා | ... | 2 0 |
| සෑම අත් කරත්තයක් සඳහා | ... ... | 2 0 |
| සෑම ජින් රික්ෂෝවක් සඳහා | ... ... | 2 0 |
| සෑම අශ්වයෙක් පෝනියෙක් හෝ කොටළුවෙක් සඳහා | ... ... | 2 50 |

10–1068/1—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

## බෙලිඅත්ත සුළු නගර සභාව

### 1967 වර්ෂය සඳහා සුනඛ බදු

### සුනඛයින් ලියා පදිංචි කිරීමේ ආඥාපනත (477 වැනි පරිච්ඡේදය)

සුනඛයින් ලියා පදිංචි කිරීමේ ආඥාපනතේ (477 වෙනි පරිච්ඡේදයේ) 4 වැනි වගන්තිය යටතේ, මෙම සුළු නගර සභා සීමාව තුළ තබාගෙන සිටින සෑම පිරිමි සුනඛයෙක් සඳහා රුපියල් 1 ක් බැගින් ද සෑම ගැණු සුනඛයෙක් සඳහා රුපියල් 1 ක් බැගින් ද, ලියා පදිංචි කිරීමේ ගාස්තුවක් 1967 වර්ෂයට අයකිරීමට පනවා ඇති බැව් බෙලිඅත්ත සුළු නගර සභාව මෙයින් ප්‍රකාශනයට පත් කරනු ලැබේ.

ඩබ්ලිව්. පී. සයිමන් සිල්වා,
සභාපති,
බෙලිඅත්ත සුළු නගර සභාව.

සුළු නගරසභා කාර්යාලය,
බෙලිඅත්ත, 1966.10.15.

10–1068/2—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

---

## බෙලිඅත්ත සුළු නගර සභාව

### 1967 වර්ෂයට වරිපනම් බදු

සුළු නගර සභා ආඥාපනත (256 වැනි අධිකාරය) යටතේ 1966 වර්ෂයට බලපවත්නා පහත සඳහන් වරිපනම් බදු 1967 වර්ෂයටද එලෙසම පැනවීමට බෙලිඅත්ත සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ :—

159 (2) වගන්තිය ප්‍රකාර මෙම සුළු නගර සභාව තුළ පිහිටා ඇති සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට හත බැගින් වූ වාර්ෂික බදු, පිළිවෙලින් මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 වෙනිදායින් අවසන් වන අයුරු කාර්තු හතරකට ගෙවිය හැකි අයුරිනි.

ඩබ්ලිව්. පී. සයිමන් සිල්වා,
සභාපති,
බෙලිඅත්ත සුළු නගර සභාව.

සුළු නගරසභා කාර්යාලය,
බෙලිඅත්ත, 1966 ඔක්තෝබර් මස 15 වැනි දින.

10–1068/3—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

---

## යටියන්තොට සුළු නගර සභාව

### ගෝ ඝාතක ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් අය විසින් ඒ අයගේ නම් ඉදිරියෙන් සඳහන් ස්ථානයන්හි මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1967 අවුරුද්දට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන යටියන්තොට සුළු නගර සභා සීමා තුළ පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණු මතයයි දැක්වෙන පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් මෙම ගැසට් පත්‍රයේ දින සිට දාහතර දවසක් ඇතුළත මා වෙත එවන ලෙස ඉල්ලා සිටින බවත්, ගෝ ඝාතක ආඥාපනතේ (සංශෝධිත ව්‍යවස්ථා ප්‍රඥප්තියේ 272 අධිකාරය), 7 (2) වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | | ස්ථානයේ නම |
|---|---|---|
| 1. ඇන්. ඩී. ඇම්. සකාප් | ... | යටියන්තොට ප්‍රසිද්ධ වෙළඳ පොළේ අංක 1 දරණ හරක් මස් කඩ කාමරය. |
| 2. සී. ඇල්. ඒ. මන්සූර් | ... | යටියන්තොට ප්‍රසිද්ධ වෙළඳ පොළේ අංක 2 දරණ හරක් මස් කඩ කාමරය. |
| 3. ඇස්. ඇම්. හසන් | ... | යටියන්තොට ප්‍රසිද්ධ වෙළඳ පොළේ අංක 1 දරණ එළුමස් කඩ කාමරය. |
| 4. සී. ඇල්. ඒ. මන්සූර් | ... | යටියන්තොට ප්‍රසිද්ධ වෙළඳ පොළේ අංක 2 දරණ එළුමස් කඩ කාමරය. |

කේ. වින්සන්ට් පෙරේරා,
සභාපති,
යටියන්තොට සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය ය,
යටියන්තොට, 1966.10.16 දින.

10–1037—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

---

## පුස්සැල්ලාව සුළු නගර සභාව

### 1967 වර්ෂයේ සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු

### සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (477 වැනි අධිකාරය

සුනඛයින් ලියාපදිංචිකිරීමේ ආඥාපනතේ (477 වැනි අධිකාරය) 4 වැනි වගන්තිය ප්‍රකාර, පුස්සැල්ලාව සුළු නගර සභාවේ පාලන සීමාව තුල ඇති කරනු ලබන සෑම බල්ලෙකු වෙනුවෙන් රු. 1 ක්ද, බැල්ලියක් වෙනුවෙන් රු. 1.50 ක්ද, 1967 මාර්තු 31 වැනිදා හෝ ඊට පෙර ගෙවන අයුරින් ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් 1967 වර්ෂයට අයකිරීමට පනවා ඇති බව නත් නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. ඩී. ඩබ්ලිව්. පෙරේරා,
පුස්සැල්ලාව සුළු නගර සභාවේ සභාපති.

1966 ඔක්තෝබර් මස 17 වැනි දින,
පුස්සැල්ලාව සුළු නගර සභා කාර්යාලයේදී ය.

10–1044—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

---

## දෙම්පෙ මාපිටිගම ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත විස්තර දක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් 1966 වර්ෂය සඳහා මරණ ලද හරක් මස් සහ ඌරු මස් ගෙනැවිත් විකිණීම පිණිස බලපත්‍රයක් ඉල්ලුම්කර සිටින බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන දෙම්පෙ මාපිටිගම් ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙකු විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධවීමට හේතු සඳහන්කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වන පරිච්ඡේදයේ 7 අංක 44 දරණ ආඥාපනතින් සංශෝධනයවූ අංක 6 දරණ ආඥාපනත යටතේ මෙයින් දනුම දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | බලපත්‍රයේ ස්වභාවය | ස්ථානය |
|---|---|---|
| කේ. ජෙරමියස් පෙරේරා... | හරක් මස් සහ ඌරු මස් | දෙම්පෙ කඩිපල අසල |

ඩී. ඒ. පී. සූරියප්පෙරුම,
දෙම්පෙ මාපිටිගම ගම්සභාවේ සභාපතිතුමා.

දෙම්පෙ මාපිටිගම ගම්සභා කාර්යාලය,
දෙම්පෙ 1966 ඔක්තෝබර් 10 වැනි දින.

10–1069—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

## පල්ලෙවෙල ගම්සභාව—කොළඹ දිස්ත්‍රික්කය

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත විස්තර දක්වෙන උපලේඛනයෙහි සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා, 1967 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කොට ඇති බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධ වන පල්ලෙවෙල ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධවන්නේ අසවල් කරුණු නිසා යයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවී දින හතක්(7) ඇතුළත මා වෙත ලියා එවීමට බලය ඇති බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ සහ 1947 අංක 44 දරණ ආඥපනතේ සංශෝධිත අංක 6 දරණ ආඥපනත අනුව මෙයින් දනුම් දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | බලපත්‍රයේ ස්වභාවය |
|---|---|---|
| යූ.ඒ. අබ්දුල් හමීදු, හංසගිරිය, කල්එළිය | කල්එළිය | ... හරක් මස් වෙළඳාම |

කේ. කේ. ආරියදස,
පල්ලෙවෙල ගම්සභාවේ සභාපති.

වර්ෂ 1966ක්වූ ඔක්තෝබර් මස 16 වැනි දින,
බාදුරාගොඩ, පල්ලෙවෙල ගම්සභා කාර්‍යාලයේදීය.

10–1064.—66.10.27 දින අංක 14,719 දරණ ගැසට් පත්‍රය

---

## කොළඹ දිස්ත්‍රික්කයේ ඔයබොඩ-පේරුව ගම්සභාව තිහාරිය

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් අය එහි සඳහන් ස්ථානවල මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1967 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බල පත්‍ර නිකුත් කිරීමට විරුද්ධ වන ඔයබොඩ-පේරුව ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණු සඳහා යයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටින සේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවන දින සිට 14 දිනක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ 272 වෙනි පරිච්ඡේදයේ අංක 7 දරණ වගන්තියේ 2/එ/ස/බී උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය සහ වෙළඳාම |
|---|---|
| 1. ඇස්. ඇම්. රසීඩ් තිහාරිය-කළගෙඩිහේන. | අංක 1, තිහාරිය හන්දිය, එළුමස් හා හරක් මස් කඩය |
| 2. පී. ඇම්. සහීඩ් තිහාරිය-කළගෙඩිහේන. | අංක 2, තිහාරිය, ගොඩැල්ල, එළුමස් හා හරක් මස් කඩය |

ඩී. ඒ. විජයසුන්දර,
ඔයබොඩ-පේරුව ගම්සභාවේ සභාපති.

1966 ඔක්තෝම්බර් 15 දින,
කළගෙඩිහේන, තිහාරිය,
ඔයබොඩ-පේරුව ගම්සභා කාර්‍යාලයේ දීය.

10–1066—66.10.27 දින අංක 14,719 දරණ ගැසට් පත්‍රය

---

## යටිනුවර මැදපළාත ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අය, එහි සඳහන් ස්ථානවල 1967 වර්ෂයට එළුහරක්මස් කඩ පවත්වාගෙන යාමට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවද, එම බලපත්‍ර නිකුත් කිරීම ගැන යටිනුවර මැදපළාත ගම්සභා ප්‍රදේශයතුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඒ කුමන කරුණක් නිසාද යන වග සඳහන් ලිඛිත ප්‍රකාශනයක් පිටපත් දෙකකින් යුක්තව මෙම දන්වීම ගැසට් පත්‍රයේ පලවන දිනයේ සිට සති දෙකක් ඇතුළත මා වෙත ඉදිරිපත් කිරීමට බලය තිබෙන බවද මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපණතේ (272 වන අධිකාරය වන) 7 වන වගන්තිය යටතේ මෙයින් දනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | වෙළඳාමේ පිළිවෙල | වෙළඳාම කරන ස්ථානය |
|---|---|---|
| කේ. ඇන්. ඇම්. තාහා, දෙහිඅංග, මුරුතලාව | එළුහරක්මස් කඩය ... | දෙහිඅංග |
| ඇස්. ඒ. ලතීප්, දෙහිඅංග, මුරුතලාව | එළුහරක්මස් කඩය ... | දෙහිඅංග |
| ඇම්. ඒ. මුත්තලිප්, මුංවතුගොඩ, දන්කුරේ | එළුහරක්මස් කඩය ... | මුංවතුගොඩ |

එම්. එල්. එම්. ඉබ්‍රාහිම්,
(ය.නු.) මැදපළාත ගම්සභාවේ සභාපති.

ගම්සභා කායාීලය, අරඹේගම,
පිළිමතලාව, 1966 ඔක්තෝබර් 16 වැනි දින.

10–1039—66.10.27 දින අංක 14,719 දරණ ගැසට් පත්‍රය

---

## 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි අධිකාරය) 3 වන වගන්තිය යටතේ, මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව උඩගම්පහ ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර, මෙයින් ප්‍රසිද්ධ කර සිටිනු ලැබේ.

### යෝජනාව

"පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1953 අප්‍රේල් මස 10 වැනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953 අගෝස්තු මස 7 වැනි දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 1 සිට 37 දක්වා වූ කාණ්ඩ මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට හාරිස්පත්තුව උඩගම්පහ ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ "1" වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කරනු ලැබේ."

එච්. ඇම්. ඩබ්ලිව්. විකිරිබන්ඩා,
සභාපති,
හාරිස්පත්තුව උඩගම්පහ ගම්සභාව.

ගම්සභා කායාීලය,
අලවතුගොඩ,
1966 ජූනි 22 වැනි දින දීය.

10–1076—66.10.27 දින අංක 14,719 දරණ ගැසට් පත්‍රය

---

## 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ කළුතර දිස්ත්‍රික්කයේ වරකාගොඩ පළාත ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කර ගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තිය ප්‍රකාර මෙයින් පළ කර සිටිනු ලැබේ.

### යෝජනාව

පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදන කරනු ලැබ 1953 අප්‍රේල් මස 10 වැනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953 අගෝස්තු මස 7 වැනි දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 1 සිට 37 දක්වා වූ (1 සහ 37 ඇතුළු) කාණ්ඩ මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට වරකාගොඩ පළාත ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

හර්මන් කත්නත්ගර,
සභාපති තැන.

වර්ෂ 1966 ක්වූ ජූනි මස 26 වැනි දින,
වරකාගොඩ පළාත ගම්සභා කාර්යාලයේ දීය,
වරකාගොඩ.

10–1050/1—66.10.27 දින අංක 14,719 දරණ ගැසට් පත්‍රය

## 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ කළුතර දිස්ත්‍රික්කයේ වරකාගොඩ පළාත ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කර ගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තිය ප්‍රකාර මෙයින් පළ කර සිටිනු ලැබේ.

### යෝජනාව

පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1963 ජූනි මස 21 වැනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් අනුමත කරන ලද බව 1965 ජනවාරි මස 8 වැනි දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 38 වැනි කාණ්ඩය, මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට වරකාගොඩ පළාත ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

හර්මන් කන්නන්ගර,
සභාපති තැන,
වරකාගොඩ පළාත ගම්සභාව.

වර්ෂ 1965 ක්වූ ජූනි මස 26 වැනි දින,
වරකාගොඩ පළාත ගම්සභා කාර්යාලයේ දීය,
වරකාගොඩ.

10–1050/2—66.10.27 දින අංක14,719 දරන ගැසට් පත්‍රය

---

## උඩුනුවර කඳුපළාත ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත දැක්වෙන උප ලේඛනයේ නම් සඳහන් අය එහි සඳහන් ස්ථානවල 1967 වර්ෂයට මස් පිණිස එළ ගවයන් මරා මස් විකිණීමේ ස්ථාන යක් පවත්වාගෙන යාමට බලපත්‍ර ඉල්වා අයදුම් පත් මා වෙත එවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ 272 වෙනි පරිච්ඡේද යේ අංක 7(2) දරණ වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

එකී බලපත්‍ර නිකුත් කිරීම ගැන මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර කඳු පළාත ගම්සභා සීමාවතුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේනම් එසේ විරුද්ධ වීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දහහතර දිනක් ඇතුළත මා වෙත එවියයුතු බව මෙයින් දන්වමි.

### උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳම |
|---|---|---|---|
| 1. | ඒ. එල්. එම්. රවුෆ්, වටදෙනිය, වෙළඹබොඩ | අටලහතැන්න ... | එළහරක් මස් |
| 2. | ඒ. සී. එම්. හාරිස්, වටදෙනිය, වෙළඹබොඩ | අටලහතැන්න ... | එළහරක් මස් |
| 3. | ඒ. ඇල්. ඒ. අසීස්, වෙළඹබොඩ | වෙළඹබොඩ පහහදෙනිය ... | එළහරක් මස් |
| 4. | මූසා ලෙබ්බෙ සේහු ලෙබ්බෙ, ගල්මුල්ලවත්ත, වෙළඹබොඩ | වෙළඹබොඩ ගල්මුල්ල වත්ත ... | එළහරක් මස් |
| 5. | වී. ඒ. හමීදු, ගල්පිහිල්ලවත්ත, කුරුකුත්තල, කඩුගන්නාව | කුරුකුත්තල ගල්පිහිල්ල වත්ත ... | එළහරක් මස් |
| 6. | ඇන්. හාමීද් ලෙබ්බෙ, වෙළඹබොඩ | වෙළඹබොඩ කඩින්ගල කුඹුර ... | එළහරක් මස් |

යූ. ඇල්. නූර්මොහමඩ්,
උඩුනුවර කඳුපළාත ගම්සභාවේ ප්‍රධානතැනා.

1966 ඔක්තෝබර් 18 වැනි දින,
උඩුනුවර කඳුපළාත ගම්සභා කායඹාලය,
වෙළඹබොඩ.

10–1052—66.10.27 දින අංක 14,719 දරන ගැසට් පත්‍රය

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළකරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස්වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් බාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අයවෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පලකල යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් බාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය.

## උපලේඛනය

**1966**

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් බාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| සැප්තැම්බර් | 66. 9. 2 | සිකුරාද | 66. 8.26 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9. 9 | සිකුරාද | 66. 9. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.16 | සිකුරාද | 66. 9. 9 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.23 | සිකුරාද | 66. 9.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.30 | සිකුරාද | 66. 9.23 | සිකුරාද | ප.ව. 3.30 |
| ඔක්තෝබර් | 66.10. 7 | සිකුරාද | 66. 9.30 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.14 | සිකුරාද | 66.10. 7 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.20 | බ්‍රහස්පතින්ද | 66.10.14 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.27 | බ්‍රහස්පතින්ද | 66.10.20 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| නොවැම්බර් | 66.11. 3 | බ්‍රහස්පතින්ද | 66.10.27 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.10 | බ්‍රහස්පතින්ද | 66.11. 3 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.18 | සිකුරාද | 66.11.10 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.25 | සිකුරාද | 66.11.18 | සිකුරාද | දවල් 12 |
| දෙසැම්බර් | 66.12. 2 | සිකුරාද | 66.11.24 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66.12. 9 | සිකුරාද | 66.12. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.12.16 | සිකුරාද | 66.12. 8 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66.12.23 | සිකුරාද | 66.12.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.12.30 | සිකුරාද | 66.12.22 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |

1966 ජුලි 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි නැගෙණහිර කඩදාසි කර්මාන්ත සංස්ථාවෙහි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි